

රණවිරුවාණෙනි, ඔබ දේශයේ අභිමානයයි

இராணுவ வீரர்களே, நீங்கள் இத் தேசத்தின் மகிமைக்குரியவர்கள

Beloved War Hero, You are the Pride of the Nation

2016

වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

Annual Report



රණවිරු සේවා අධිකාරිය

ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය

ரணவிரு சேவா அதிகாரசபை

பாதுகாப்பு இராஜாங்க அமைச்சு

Ranaviru Seva Authority

State Ministry of Defence

2016
වාර්ෂික වාර්තාව

රණවිරු සේවා අධිකාරිය

ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය

2016 වර්ෂයට ප්‍රවේශයක්.....

යුද්ධය නිම වී ගත වූ වසර 06 ක කාලය තුල රණවිරු සේවා අධිකාරිය කරන ලද අධ්‍යනයන්ට අනුව දශක තුනක යුද්ධය රණවිරු ප්‍රජාව වෙත කරන ලද බලපෑම හඳුනාගැනීමට හැකිව ඇත.

2016 වර්ෂයට අදාලව සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී එම අධ්‍යයනයන්ගෙන් හඳුනා ගන්නා ලද වඩාත් සංවේදී ගැටළු කෙරෙහි අවධානය යොමු කොට ප්‍රමුඛතාවයන් අනුව කටයුතු කරන ලදි. යුද්ධය අවසන් වී කාලයක් ගතවීමත් සමග සමාජයට අමතකව යමින් තිබූ රණවිරුවන් පිළිබඳ මතකය ආවර්ජනය කරමින් ඔවුන්ව සාමාජයක් ලෙස රටක් ලෙස ලබාදීය යුතු ගෞරවය හා පිළිගැනීම ලබා දීමට අවශ්‍ය වන ලෙස “ විරුසර වරප්‍රසාද කාඩ්පත ” ප්‍රධානය කිරීමේ වැඩසටහන ප්‍රමුඛතම කාර්යක් ලෙස සලකා රණවිරු සේවා අධිකාරිය විසින් ක්‍රියාවට නංවන ලදි. එමඟින් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙතින් රණවිරු ප්‍රජාවට පිලිගැනීම, ප්‍රමුඛතාවය මෙන්ම මූල්‍යමය වරප්‍රසාද අත්පත් කර දීමට 2016 වර්ෂය තුල ආයතනයට හැකි විය.

එමෙන්ම පරිපාලනමය වශයෙන් කාර්යය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කරමින් ග්‍රාමීය මට්ටම දක්වා වඩාත් පුළුල් සේවාවක් රණවිරු ප්‍රජාවට සමීපව ලබා දීමට වැඩසටහන් නිළධාරින් 32 දෙනෙකු බදවාගැනීමට කටයුතු කර ඇත.

ඊට අමතරව අධිකාරියේ පනතින් පැවරී තිබූ, ආයතය ආරම්භයේ සිට කරගෙන ආ සුභසාධන සේවාවන් වඩාත් විධිමත්ව ඵලදායි ප්‍රතිපල අත් කරගත හැකි වන ලෙස ක්‍රියාත්මක කරන ලදි.

පටුන

රණවිරු සේවා අධිකාරිය 1

අපේ දැක්ම හා අපේ මෙහෙවර 2

රණවිරු සේවා අධිකාරියේ කර්තව්‍ය 3

ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමන්ගේ පණිවුඩය 4

ආරක්ෂක රාජ්‍ය ලේකම්තුමන්ගේ පණිවුඩය 5

සභාපතිතුමියගේ පණිවුඩය 6

උප සභාපතිතුමියගේ පණිවුඩය 7

ආයතනික අධ්‍යක්ෂ මණ්ඩලය 8

අපගේ ක්‍රියාත්මක ව්‍යාපෘති 9

- ආබාධිත රණවිරු පසු උවටැන සහ පුනරුත්ථාපනය කිරීම 10
- රණවිරු නිවාස සැපයීම සහ එහි ලා සහාය වීම 13
- වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම 18
- අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාව සැලසීම 23
- ඵලදායී සේවානියුක්තියක් සුරක්ෂිත කිරීමෙහි ලා සහාය වීම 29
- අධිකාරියේ කර්තව්‍යයන් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු දෑ කිරීම.... 32

විගණකාධිපති වාර්තාව..... 40

අවසාන ගිණුම් ප්‍රකාශය 49

වාර්ෂික වාර්තාව - 2016 **දෙමළ පරිවර්තනය**

වාර්ෂික වාර්තාව - 2016 **ඉංග්‍රීසි පරිවර්තනය**

රණවිරු සේවා අධිකාරිය

ගෝත්‍රික ජන සමාජයේ ගෝත්‍ර නායකයා රජු බවට පත් වීමත් සමඟම ගෝත්‍රයට අනන්‍ය වූ බිම් රැකීම සඳහා ශරීර ශක්තියෙන් අනූනයන් භූමිය ආරක්ෂාව සඳහා යෙදවීම යනු මානව ශිෂ්ටාචාරයේ ආරක්ෂක සේවයේ මූලාරම්භයයි. ශිෂ්ටාචාරය නොයෙකුත් කාලීන ප්‍රවණතා සමඟ පරිපාකයට පත්වීමත් සමඟ සම්මත නීතියකට සහ විනයකට අනුව ගුණාත්මක මෙන්ම ප්‍රමාණාත්මක වර්ධනයක් ආරක්ෂක සේවයේ ද දකින්නට ලැබුණි.

වෘත්තියට සහ ඉපයීමට පමණක් සීමා නොවූ ආරක්ෂක වෘත්තියේ වෘත්තිකත්වය දිවි හිමියෙන් කටයුතු කිරීම නිසා උත්තරීතරත්වයට පත් වෙන ලදී. එබැවින් ආරක්ෂක සේවය වනාහි ලෝකයේ සෑම රටකම ජනතාවගේ ගෞරවාදරයට පත් වූ උතුම් වෘත්තියකි.

ඓතිහාසික යුගයේ සිට මෙරටට එල්ල වූ ආක්‍රමණ හමුවේ මෙන්ම අභ්‍යන්තර සිවිල් අරගල හමුවේ රජු, සේනාපති ප්‍රමුඛ ඒ ඒ සේනාංක විසින් ඉටු කරන්නා වූ රණවිරු මෙහෙය 1972 ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් වී ස්වයං පාලන අයිතිය හිමි කර ගැනීමත් සමඟම ආරක්ෂක සේවය ද කාලීන වෙනස්කම් වලට භාජනය වෙමින් අද්‍යකාලීන තත්ත්වය දක්වා ඔපමට්ටම් වී සැකසෙන ලදී. ලාංකීය ඉතිහාසය තුළ දරුණුතම ත්‍රස්තවාදයට මුහුණ දී තිස් වසරක යුද්ධය අවසන් කළ ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ රණවිරුවන් ඉතිහාසයේ වීර පරපුරක හැඩය මෑත ඉතිහාසය තුළ තව තවත් ඔපවත් කළේ රටේ ශක්තිය සහ රටේ පෞරුෂය රණවිරුවන් බව ප්‍රත්‍යක්ෂ කරමින්ය.එකී ත්‍රස්තවාදයට මුහුණ දී දිවි පිදූ, සොයා ගත නොහැකි වූ සහ ශරීරාංග අහිමි වූවන් සහ ඔවුන්ගේ යැපෙන්නන් ගේ සුභසාධනය වෙනුවෙන් කටයුතු කිරීම ඕනෑම රජයක යුතුකම හා වගකීම විය යුතුය. ඒ ඔවුන්ගේ කැප කිරීම පෞද්ගලිකත්වයෙන් ඔබ්බට ගියා වූ ජනතා සේවයක් නිසාය.

පුරා දශක දෙකකට ආසන්න කාලයක් පැවැති යුද්ධය අර්බුදයට සෘජුව සම්බන්ධ වී උතුම් සේවයක් කළ රණවිරුවන්ගේ අභිවෘද්ධියට සහ කෘතවේදිත්වය දැක්වීමට පොදු ආයතනයක් 1999 දී එවකට හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මැතිණියගේ උදාර සංකල්පයකට අනුව අංක 54 දරණ පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත කරන ලදී.එකී ආයතනය රණවිරු සේවා අධිකාරිය නම් විය.

ක්‍රියාන්විතයේ දී ශරීරාංග අහිමි ව සිටින ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ රණවිරුවන්ගේ සහ ක්‍රියාන්විතයේ දී දිවි පිදූ හෝ සොයා ගත නොහැකිව සිටින ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ රණවිරුවන් හා යැපෙන්නන්ගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂාංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස රණවිරු සේවා අධිකාරිය ස්ථාපිත කර ඇත.



අපේ දැක්ම....

රණවිරු නාමයට ජාතියේ
කෘතගුණ දැක්වීම.



අපේ මෙහෙවර....

ශ්‍රී ලාංකාවේ ඒකීය භාවය
සුරක්ෂිත කරනු පිණිස ජීවිත පුද
කළා වූ අතුරුදහන් වූ හා ආබාධිත
වූ රණවිරුවන් සහ ඔවුන්ගේ
පවුල්වල සාමාජිකයන්ගේ
මානසික හා සාමාජීය
ස්ථාවරභාවයක් ඇති කිරීම
මෙන්ම සේවයේ නියුතු
රණවිරුවන් සහ එම පවුල් වල
මානසික ප්‍රබෝධයක් ඇති වන
අයුරින් ක්‍රියා කිරීම.

රණවිරු සේවා අධිකාරියේ කර්තව්‍ය

(අ) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත් ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ **පසු උවටැන සහ, ඔවුන් පුනරුත්ථාපනය කිරීම** සඳහා විධිවිධාන සැලැස්වීම;

(ආ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට;

නිවාස සැපයීම සහ එහි ලා සහාය වීම ;

(ඇ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට

වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම ;

(ඈ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට,

ශිෂ්‍යත්ව සහ වෙනත් ආකාරයේ උපකාර ලබා දීමෙන් ඔවුන්ට අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබාගැනීමට අවස්ථාව සලසා දීම ;

(ඉ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට ; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය සහ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට,

ඵලදායී සේවානියුක්තියක් සුරක්ෂිත කිරීමෙහි ලා සහාය වීම;

(ඊ) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට **සේවා නියුක්තිය සැලසීමේ අරමුණු ඇතිව කාර්මික, කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යවසායයන් පිහිටුවීම**; සහ

(උ) අධිකාරියේ කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර **සියලු ක්‍රියා හා දේ කිරීම.**

ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමන්ගේ පණිවුඩය



රටේ හෙට දවස වෙනුවෙන් මෙන්ම අනාගත පරපුරට නිදහස් නිවහල් සාමකාමී දැයක් වෙනුවෙන් සුවිශේෂී පරිත්‍යාගයක් සිදුකල රණවිරුවන්ට මෙන්ම ඔවුන්ගේ සමීපතම ඥාතීන්ගේ හෙට දවස සුරක්ෂිත කිරීම සඳහා කැපවීම අප සැමගේ පරම යුතුකමකි. මුළුමහත් ලාංකීය සමාජයේ සුරක්ෂිතභාවය වෙනුවෙන් ස්වකීය ජීවිත හා ශරීරාංග පූජාකල රණවිරුවන් වෙනුවෙන් ඉටුකල යුතු වගකීම් රැසක් තවදුරටත් අප හමුවේ ඇති බව මාගේ විශ්වාසයයි.

උතුම් පරිත්‍යාග රැසක් සිදුකල රණවිරුවන්ගේ අභිවෘද්ධියට මෙන්ම ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුභසාධනය සහ අනාගත අපේක්ෂාවන් සාධනීය කිරීම සඳහා නිරතුරුව රණවිරු සේවා අධිකාරිය කැපවීමෙන් මෙහෙවරක නිරතව සිටී.

2015 පටන් සංහිදියාවේ අරමුණ සාක්ෂාත් කිරීම සඳහා " රණවිරු සේවා අධිකාරිය " නවමු ව්‍යාපෘතීන් රැසක් කෙරෙහි අවධානය යොමුව ඇත. ඒ සඳහා ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය ලෙස අප නිරතුරුවම අවශ්‍ය මඟපෙන්වීම සිදුකරනු ලබයි. මුළුමහත් රණවිරු ප්‍රජාවම ආර්ථික, සාමාජීය, සංස්කෘතික වශයෙන් ශක්තිමත් කිරීම අප සියලුදෙනාටම පැවරෙන වගකීමක් ලෙස අධිෂ්ඨානකොට ගනිමින් 2015 පටන් ඇරඹී වැඩසටහන් අප සියලුදෙනාම අධිෂ්ඨානශීලිව ඉදිරියට ගෙන යායුතුය.

රණවිරු සේවා අධිකාරිය මඟින් 2015 පටන් නවමු තේමාවන් ඇතිව ආරම්භකල විවිධ වැඩසටහන් යථාර්ථයක් කිරීමට කැපවන රණවිරු සේවා අධිකාරියේ සභාපතිනි අනෝමා ෆොන්සේකා මහත්මිය ඇතුළු සියලු නිළධාරින්ටත් අනෙකුත් සියලුම කාර්යමණ්ඩලයටත් මාගේ විශේෂ ස්තුතිය පිරිණමමි. රණවිරුවන් ඇතුළු ඔවුන්ගේ සමීපතයින්ට යහපත් සේවාවක් ඉටුකිරීමට රණවිරු සේවා අධිකාරියට ඉදිරි වර්ෂය තුළදීත් හැකිවේවායි ප්‍රාර්ථනා කරමි.

රුවන් විජයවර්ධන
ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය

ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය



මව්බිමට සාමය ළඟා කර ගැනීම සඳහා තම ජීවිතය කැප කළ, ශාරීරාංග පුජා කළ විරෝධාර රණවිරුවන්ට හා ඔවුන්ගේ ළඟම ඥාතීන්ට අභිමානයෙන් යුතුව ජීවත්වීමේ සහ ඔවුන් සාමාජීය, ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ අරමුණින් රණවිරු සේවා අධිකාරිය ස්ථාපිත කර ඇත.

ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ගරු රුවන් විජයවර්ධන මැතිතුමාගේ මහ පෙන්වීමත්, ආරක්ෂක අමාත්‍යාංශයේ සහයෝගයත්, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණයත්, රණවිරු සේවා අධිකාරියේ සභාපති ඇතුළු කාර්ය මණ්ඩලයේ දැඩි කැපවීමත් මත රණවිරුවන්ගේ සාමාජීය හා ආර්ථික මට්ටම ඉහළ නැංවීම ඇතුළු සුභ සාධනය වෙනුවෙන් ජයග්‍රාහී ඉලක්ක රැසක් ළඟා කර ඇති බව දන්වන්නේ හදපිරි සතුටිනි.

පසුගිය වසර දෙස ආපසු හැරී බලද්දි රණවිරු සේවා අධිකාරිය මගින් රණවිරුවන්ගේ සුභ සාධනය ඉහළ නැංවීම සඳහා කළ දෑ බොහෝය. මියගිය, ආබාධිත රණවිරුවන්ගේ සහ යුධ බිමේදී ශක්තියක් වූ සිවිල් කාර්ය මණ්ඩලය ඇතුළු රණවිරුවන් 30,000 කට අධික සංඛ්‍යාවක් සඳහා විශේෂ වරප්‍රසාද ලැබෙන “ විරුසර වරප්‍රසාද ” කාඩ්පත ප්‍රධානය කිරීමට හැකි වීම ඉන් එක් ජයග්‍රහණයකි.

තවද, ක්‍රියාන්විත සේවයේ යෙදී සිට මිය ගිය, ශාරීරාංග පුජා කළ රණවිරුවන්ගේ සහ ඔවුන්ගේ ළඟම ඥාතීන්ගේ හිසට සෙවණක් ලබා දීමේ අරමුණින් ඉදිරි වර්ෂ 05 තුලදී පූර්ණ සහ අර්ධ නිවාස 3650 ක් සැදීමේ ව්‍යාපෘතිය සකස් කරන ලදි.

එසේම, ආබාධිත රණවිරුවන් සඳහා ආබාධිත උපකරණ 650 ක් ලබා දීම ද, රණවිරු දුවා දරුවන්ගේ හෙට දවස දීප්තිමත් කිරීම සඳහා ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ශිෂ්‍යත්ව 3150 ක් පිරිනැමීමද, රණවිරු මව්පියන් සඳහා රු. 750 බැගින් වූ රණවිරු මාපිය රැකවරණ ප්‍රතිලාභ 35,000 ක් ලබා දීම ද, නිවාස සහ ණය ආධාර 625 ක් ද ලබා දීමට හැකිවීම පසුගිය වසරේදී රණවිරු සේවා අධිකාරිය ලැබූ තවත් ජයග්‍රහණ කිහිපයකි.

එළඹෙන නව වසරේදී ද රණවිරුවන්ගේ හෙට දවස දීප්තිමත් කිරීම සඳහා ඔවුන් වෙත ලබාදෙන සේවාවන් වඩාත් පුළුල් කරමින් ඔවුන් සමාජයේ ඉහළට ඔසවා තැබීමට රණවිරු සේවා අධිකාරියට හැකි වේවායි මා ප්‍රාර්ථනා කරමි !

ඒ.පි.ජී. කිත්සිරි
ලේකම්
ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය

සභාපතිතුමියගේ පණිවුඩය



ශ්‍රී ලංකා ද්වීපයේ ඒකීයභාවය සහ භෞමික අඛණ්ඩතාවය උදෙසා මානුෂීය මෙහෙයුම් වල යෙදෙමින් සටනේදී තම ජීවිත පරිත්‍යාග කල රණවිරුවන්ගේ පවුල්වල සාමාජික සාමාජිකාවන්ගේ සහ ශරීරාංග පරිත්‍යාග කල රණවිරුවන්ගේ මනෝ සමාජීය, අධ්‍යාපනික හා ආර්ථික ස්ථාවරත්වය වර්ධනය කරමින් සාමයෙන්, සංහිදියාවෙන් යුතුව කටයුතු කරමින් වේගවත් ආර්ථික සංවර්ධනයක් ළඟා කර ගැනීමට අවශ්‍ය පරිසරය රට තුළ නිර්මාණය කිරීමේ කාර්ය භාරය 1999 අංක 54 දරණ පනතින් ස්ථාපිත රණවිරු සේවා අධිකාරියට පැවරී ඇත.

2015 වර්ෂයෙන් ආරම්භ කරන ලද නව උපාය මාර්ගික සැලසුමක දෙවන වසර ලෙස 2016 වර්ෂය හඳුන්වා දිය හැකිය. යුධ ජයග්‍රහණයෙන් වසර කිහිපයක් ගත වන විට රණවිරුවන් හා රණවිරු ප්‍රජාව පිලිබඳ රට තුළ තිබූ අභිමානය, ගෞරවය හා පිළිගැනීම කෙමෙන් අඩුවෙන් පැවතින. 2016 වර්ෂය තුළ හඳුන්වා දෙන ලද "විරුසර වරප්‍රසාද" වැඩසටහන එම පරිසරය වෙනස් කරමින් රණවිරුවාට අභිමිවෙමින් පැවති සමාජ අවධානය ළඟා කර ගැනීමට මහගු උපකාරයක් විය. එමෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙතින් මූල්‍යමය හා මූල්‍යමය නොවන වරප්‍රසාද විශාල ප්‍රමාණයක් රණවිරු ප්‍රජාව වෙත ලබා දීමට හැකි විය.

"විරුසර වරප්‍රසාද" වැඩසටහනෙහි සංකල්පය සමාජ ගත කරමින් එය යථාර්ථයක් කරලීමට නායකත්වය දුන් ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය රුවන් විජයවර්ධන මැතිතුමන් හා ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමන්ගෙන් ලද සහයෝගය කෘතඥ පුර්වකව සිහිපත් කරමි.

දිවයින පුරා විසිරි ජීවත් වන රණවිරු ප්‍රජාවගේ සුභසාධන කටයුතු දීප ව්‍යාප්ත මට්ටමින් සපුරාලමින් 2016 වර්ෂය තුළදී සාර්ථක ප්‍රතිඵලයන් අත් පත් කර ගැනීමට කටයුතු කල රණවිරු සේවා අධිකාරියේ උපසභාපතිනිය, අධ්‍යක්ෂතුමන් ඇතුළු කාර්යය මණ්ඩලයේ සියලුම සාමාජික සාමාජිකාවන්ට හා ඊට සහය දැක්වූ ත්‍රිවිධ හමුදාව සහ පොලිස් දෙපාර්තුමේන්තුවෙන් කාර්යාලට අනුයුක්ත කර ඇති සියලු නිළධාරින් ඉටුකළ කාර්යභාරය කෘතඥ පුර්වකව සිහිපත් කරමි.

සැලසුම් සහගත වැඩපිළිවෙලක තෙවන වර්ෂය වන 2017 වර්ෂයේ ආරම්භ වන රණවිරු පවුල් සාමාජික සාමාජිකාවන්ගේ නිවාස අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමට සිවු අවුරුදු ක්‍රියාන්විතයට ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශයේත් රණවිරු සේවා අධිකාරියේ කාර්යමණ්ඩලයේත් සහයෝගය 2016 වසරේ මෙන්ම ලබාදෙනු ඇතැ'යි අපේක්ෂා කරමි.

අනෝමා ෆොන්සේකා
සභාපතිනිය
රණවිරු සේවා අධිකාරිය

උප සභාපතිතුමියගේ පණිවුඩය



1999 අංක 54 දරණ පාර්ලිමේන්තු පනතට අනුව 2000 වර්ෂයේදී රණවිරු සේවා අධිකාරිය දශක දෙකකට ආසන්න කාලයක් තිස්සේ රුදුරු ත්‍රස්තවාදයට එරෙහිව පැවති සටනේදී ලක් මාතාව වෙනුවෙන් කැපකිරීම් සහ මෙහෙයන් ඉටු කරමින් ද මවුබිමේ අනාගතය වෙනුවෙන් ජීවිත පුජා කල ,ශරීර අවයව පුජා කළ විරෝධාර රණවිරුවන් සහ එම පවුල් වල සුරක්ෂිතභාවය සහ සුභ සාධනය උදෙසාම 2000 වසරේ අංක 54 දරණ පාර්ලිමේන්තු පනතට අනුව ස්ථාපිත කල රණවිරු සේවා අධිකාරිය අඛණ්ඩව වසර 16 පුරාවට එම සේවාව සපයමින් ජාතික මෙහෙවරට උරදී ඇත.

ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ, රණවිරු සේවා අධිකාරියේ කළමනාකරණ මණ්ඩල සාමාජිකයින්ගේද උපදෙස් මත තව තවත් පුළුල්ව සේවාවන් ඉටුකිරීමට රණවිරු සේවා අධිකාරියට ඉඩ ප්‍රස්ථා ලැබී ඇත.මාතෘ භූමියේ ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩතාවය, ඒකීයභාවය ආරක්ෂා කරමින් දිවි හිමියෙන් කටයුතු කල වීරවරයන්, වීරවරියන් සහ එම පවුල් සාමාජිකයන්ගේ කාලීන අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් ආරම්භයේ සිට ව්‍යාපෘති වැඩි ගුණාත්මක භාවයකින් සකස් කරන ලද අතර රණවිරු පවුල් සාමාජිකයන්ගේ හා ආබාධිත රණවිරුවන්ගේ අවශ්‍යතාවන්ට ගැලපෙන අයුරින් නව ව්‍යාපෘතින්ද සකස් කොට ක්‍රියාත්මක කරන ලදී.

රණවිරු සංසද ව්‍යවස්ථාවද නව සැලැස්මකට අනුව සකසන ලද අතර සියලුම ප්‍රතිලාභීන් සඳහා නිසි පරිදි සේවාවන් ලබාදීමට අප අධිකාරියේ නිළධාරින් සම්බන්ධ කරමින් අවශ්‍ය සම්බන්ධීකරණයන් සහ විධි විධාන ලබා දෙමින් කටයුතු කිරීමට හැකියාව ලැබුණි.

මාතෘභූමියේ අනාගතය වෙනුවෙන් තම ජීවිතය පුජා කල රණවිරුවන්ගේ යැපෙන්නන් සහ තම අහපසඟ පුජා කර, ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන් ඇතුළු ඔවුන්ගේ දෙමාපියන්, බිරින්දෑවරුන් සහ දු දරුවන්ගේ ජීවිත සාර්ථකව ගොඩනැංවීමට රණවිරු සේවා අධිකාරිය තව දුරටත් ප්‍රබල අත්වැලක් වනු ඇතැ'යි මාගේ අපේක්ෂාවයි.

Upulangani Malagamuwa

උපුලංගනී මාලගමුව
උප සභාපතිනි
රණවිරු සේවා අධිකාරිය

ආයතනික අධ්‍යක්ෂක මණ්ඩලය

1. **අනෝමා ෆොන්සේකා මහත්මිය**
   සභාපතිනි, රණවිරු සේවා අධිකාරිය

2. **උපුලාංගනී මාලගමුව මහත්මිය**
   උප සභාපතිනි, රණවිරු සේවා අධිකාරිය

3. **ඩබ්.ඒ.කුලසූරිය මහතා**
   අතිරේක ලේකම්, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය

4. **ඒ.එන්.හපුගල මහතා**
   අධ්‍යක්ෂ, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
   මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

5. **මේජර් ජනරාල් එච්.සී.පී. ගුණතිලක මහතා**
   මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය

6. **රියද් අද්මිරාල් එස්. එස්.රණසිංහ මහතා**
   මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය

7. **එයාර් වයිෂ් මාර්ෂල් ඩී.එල්.එස්. ඩයස් මහතා**
   අධ්‍යක්ෂ සුබ සාධක, ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය

8. **එම්.ඩී. රජිත ශ්‍රී දමින්ද මහතා**
   නියෝජ්‍ය පොලිස්පති සුබ සාධක, ශ්‍රී ලංකා පොලිසිය

9. **මේජර් ජනරාල් ඩී.එම්.ඩි අල්විස් මහතා**
   කළමනාකරණ මණ්ඩල සාමාජික

10. **ජී.පී.නිල්මිණි පෙරේරා මහත්මිය**
    කළමනාකරණ මණ්ඩල සාමාජික

11. **ඩබ්.පී.නිමල් ප්‍රනාන්දු මහතා**
    කළමනාකරණ මණ්ඩල සාමාජික

අපගේ ක්‍රියාත්මක ව්‍යාපෘති

ආබාධිත රණවිරු පසු උවටැන සහ පුනරුත්ථාපනය කිරීම — පිටු අංක 10 - 12

රණවිරු නිවාස සැපයීම සහ එහි ලා සහාය වීම් — පිටු අංක 13 - 17

වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම — පිටු අංක 18 - 22

අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාව සැලසීම — පිටු අංක 23 - 28

ඵලදායී සේවානියුක්තියක් සුරක්ෂිත කිරීමෙහි ලා සහාය වීම — පිටු අංක 29 - 31

අධිකාරියේ කර්තව්‍යයන් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු දෑ කිරීම — පිටු අංක 32 - 39

- 01 -

ආබාධිත රණවිරු පසු උවටැන සහ පුනරුත්ථාපනය

ආබාධිත රණවිරුවන්ගේ ආබාධිත තත්ත්වයන් හේතුවෙන් ඔවුන් මුහුණ පාන අපහසුතා මඟහරවාලීම සඳහා ඔවුන්ට අවශ්‍ය ආබාධිත උපකරණ වන කෘතිම පාද, මුත්‍රා බෑග්, රෝද පුටු, අත්වාරු ආදී උපකරණ ලබා දීම හා විවිධ ආබාධයන්ට ලක්වූ රණවිරුවන් එදිනෙදා මුහුණපාන සනීපාරක්ෂක ගැටලු නිරාකරණය කරගැනීමේදී මුහුණපාන අපහසුතාවයන් මඟහරවාලීම සඳහා සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කර දීම මෙමඟින් අපේක්ෂිතය.

1.1. ආබාධිත උපකරණ ලබා දීම



ආබාධිත විශ්‍රාමික රණවිරුවා යනු සාමාන්‍ය පුද්ගලයෙකුට වඩා සුවිශේෂී අයෙක් වන අතර ඔවුන්ගේ ආබාධිත බව අභිබවා දෛනික ජීවිතය ගැටලුවකින් තොරව පවත්වාගෙන යාමට නොයෙක් ආකාරයේ සහායන් අත්‍යවශ්‍යය. ඉන් ප්‍රධානම වන්නේ ආධාරක උපකරණ ලබාදීමයි.

ආබාධිත විශ්‍රාමික රණවිරුවන්ට ඔවුන්ගේ ආබාධිත බවට අනුරූපව සුදුසු ආධාරක උපකරණ ලබාදීම අරමුණු කරගත් මෙය 2016 වර්ෂයේදී කෘතිම පාද 471 ක් හා ප්‍රතිලාභීන් 03 දෙනෙකු සඳහා මුත්‍රා බෑග් 110 ක් හා උපකරණ ලබා දෙන ලදි.

ඒ අනුව ආබාධිත උපකරණ ලබා දීම වෙනුවෙන් රණවිරු සේවා අධිකාරිය විසින් රු. 9,149,000.00 ක මුදලක් 2016 වර්ෂයේ දී වැය කොට ඇත.

ඒ අනුව එම උපකරණ පළාත් මට්ටමින් බෙදී ගිය ආකාරය පහත පරිදි වේ.

අංක	උපකරන වර්ගය	පළාත	ප්‍රමාණය
01.	කෘතිම පාද	වයඹ පළාත	177
		දකුණු පළාත	173
		මධ්‍යම පළාත	74
		නැගෙණහිර පළාත	47
02.	මුත්‍ර බෑග් සහ උපකරණ	මධ්‍යම පළාත	01
		සබරගමුව පළාත	01
		බස්නාහිර පළාත	01

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)

1.2. සනීපාරක්ෂක ආධාර ලබා දීම



විවිධ කායික රෝගාබාධයන්ට ගොදුරු වූ පුද්ගලයන්ට සනීපාරක්ෂක පහසුකම් සැලසීමේදී ඔවුන්ගේ ආබාධිත තත්ත්වයන්ට ගැලපෙන ආකාරයේ වැසිකිලි, ජල කරාම, ප්‍රවේශ මාර්ග, ආධාරක සහ ජල සැපයුම් ආදිය සපයා දීම එම පුද්ගලයින්ගේ පමණක් නොව ඔවුන් රැකබලාගන්නන්ට ද පහසුවක් වේ.

ආබාධිත විශ්‍රාමික රණවිරුවන් හා දිවිපිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් පීඩා විඳින කායික අපහසුතාවයන්ට හා රෝග තත්ත්වයන්ට ගැලපෙන ආකාරයේ සනීපාරක්ෂක පහසුකම් සපයා ගැනීමට සහාය වීම අරමුණු කරගත් මෙම ආධාර ලබා දීමේ වැඩසටහන සඳහා ඉලක්ක ගත කණ්ඩායම පහත පරිදි වේ.

- සනීපාරක්ෂක පහසුකම් නිසි ලෙස නොමැති ආබාධිත විශ්‍රාමික රණවිරුවන්.
- කායික රෝගාබාධායන්ගෙන් පෙළෙන හෙයින් සුවිශේෂී සනීපාරක්ෂක පහසුකම් ඇවැසි යැයි වෛද්‍යවරුන් විසින් නිර්දේශ කරනු ලබන, එහෙත් සනීපාරක්ෂක පහසුකම් නිසි ලෙස නොමැති ආර්ථික දුෂ්කරතාවන්ගෙන් පෙළෙන දිවි පිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන්.

මෙම ආධාර ක්‍රමය යටතේ රු. 50,000.00 ක මුදලක් ලබා දෙන අතර එය රු. 30,000.00 හා රු 20,000.00 වශයෙන් වාරික දෙකකට ලබා දේ. 2016 වර්ෂයේ දී නව ප්‍රතිලාභීන් 78 දෙනෙකු සඳහා හා පැරණි ප්‍රතිලාභීන් 73 සඳහා ආධාර ලබා දී ඇත. ඒ සඳහා රණවිරු සේවා අධිකාරිය රු. 3,097,631.00 ක මුදලක් වැය කොට ඇත.

ඒ අනුව 2016 වර්ෂයේ ලබා දුන් නව ආධාර 78 බෙදී ගිය ආකාරය පහත පරිදි වේ.


අනු අංක	පළාත	ලබා දුන් ආධාර ප්‍රමාණය
01	බස්නාහිර පළාත	15
02	උතුරු මැද පළාත	11
03	මධ්‍යම පළාත	05
04	දකුණු පළාත	09
05	සබරගමුව පළාත	05
06	වයඹ පළාත	07
07	ඌව පළාත	22
08	නැගෙණහිර පළාත	04

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)

ආබාධිත රණවිරු පසු උවටැන සහ පුනරුත්ථාපනය වෙනුවෙන් 2016 වර්ෂයේ ප්‍රගතිය කරා ලඟා වීම පහත පරිදි වේ.

ආබාධිත රණවිරු පසු උවටැන සහ පුනරුත්ථාපනය	2016 භෞතික		2016 මූල්‍ය (රු.මි)	
	ඉලක්කය	ප්‍රගතිය	වෙන්කිරීම	ප්‍රගතිය
සනීපාරක්ෂක ආධාර - නව	78	78	3.284	3.098
සනීපාරක්ෂක ආධාර - පැරණි	97	97		
ආබාධිත උපකරණ - කෘතිම පාද	349	471	9.149	9.149
මුත්‍ර බෑග් (පුද්ගලයින්)	03	03		

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)



(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)

- 02 -

රණවිරු නිවාස සැපයීම සහ එහි ලා සහාය වීම්

ක්‍රියාන්විතයේදී ආබාධිත රණවිරුවන් සදහා සහ මියගිය හෝ සොයාගත නොහැකි රණවිරුවන්ගේ යැපෙන්නන්ට නිවාස සැපයීම හා එහිලා සහාය වීම සදහා ඉඩම් නොමැති රණවිරු පවුල් වෙත රජයේ ඉඩම් ලබා දීම, මූල්‍ය ආධාර , සහන ණය හා තාක්ෂණික ඥාණය ලබා දීම, නිවාස ඉදිකර ගැනීම සදහා සහාය වීම රණවිරු සේවා අධිකාරිය මගින් සිදු කරන අතර හදිසි ආපදාවකදී ඔවුන්ගේ නිවාස හා දේපළ වලට සිදු වන හානි රැසක් සදහා රණවිරු පවුල් වෙත අස්වැසිල්ලක් වන අරමුණෙන් කඩිනම් පිළියම් යෙදීම මේ යටතේ සිදු කරනු ලැබේ.

2.1. නිවාස ආධාර ලබා දීම



තම මාතෘ භූමියේ ඒකීයභාවය වෙනුවෙන් ජීවිතය පුජා කළ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් වෙත මෙන්ම තම ශාරීරාංග අහිමි වූ රණවිරුවන් උදෙසා, ඔවුන් වෙත හිසට සෙවනක් ලබා ගැනීමේ අරමුණ ඉටු කර ගැනීමට ශක්තියක් වෙමින් ආර්ථික, මානසික හා සාමාජීය ස්ථාවරත්වයක් ඇති කිරීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක කරන්නා වූ ආධාර ලබා දීමේ ව්‍යාපෘතියකි.

මෙමඟින් රුපියල් ලක්ෂයක මුදලක් ආධාර වශයෙන් ලබා දෙන අතර එය රු. 60,000.00 හා රු. 40,000.00 වශයෙන් වාරික දෙකකින් ලබා දීම සිදු කෙරේ. පළමු වාරිකය ලබාගෙන ප්‍රගතිය පෙන්වා එය ග්‍රාම නිළධාරි හා ප්‍රාදේශීය ලේකම් සහතික කළ ඡායාරූපයක් ව්‍යාපෘතිය වෙත එවීමෙන් පසු දෙවන වාරිකය නිදහස් කරනු ලැබේ.

ඒ අනුව 2016 වර්ෂයේ සඳහා නව නිවාස ආධාර 25 ක් ලබා දීමට ඉලක්ක ගත කර තිබූ අතර ඉන් ප්‍රතිලාභීන් 23 ක් සඳහා ආධාර මුදල් ලබා දෙන ලදි. තවද 2016 වර්ෂයට පෙර ලබා දී තිබූ නිවාස ආධාරයන්හි 2 වන වාරික 68 ක් ද මෙම වර්ෂය තුල ලබා දීම සිදු කරන ලදි. ඒ අනුව 2016 වර්ෂය තුල රණවිරු පවුල් වෙත හිසට සෙවනක් ලබා ගැනීමට ශක්තියක් වෙමින් රු. 4,580,000.00 ක් වැය දරා ඇත.

ඒ අනුව එය පළාත් මට්ටමින් බෙදී ගිය ආකාරය පහත පරිදි වේ.

අනු අංකය	පළාත	නව ප්‍රතිලාභ ලබා දීම	දෙවන වාරික ලබා දීම
01	මධ්‍යම පළාත	04	13
02	වයඹ පළාත	04	14
03	උතුරු මැද පළාත	04	03
04	සබරගමුව පළාත	-	17
05	ඌව පළාත	03	06
06	නැගෙණහිර පළාත	04	01
07	දකුණු පළාත	03	05
08	බස්නාහිර පළාත	01	09
	එකතුව	**23**	**68**

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)

2.2. සංසද හා ගම්මාන සඳහා නිවාස ණය ලබා දීම



රණවිරු සංසද හා ගම්මානවල සිටින රණවිරු පවුල්වල සාමාජික සාමාජිකාවන්ගේ නිවසක් ගොඩනඟා ගැනීමේ සිහිනය සැබෑ කිරීමේ අරමුණින් යුතුව රණවිරු සේවා අධිකාරිය විසින් නිවාස ණය ලබා දීම සිදු කෙරේ.

රු. 300,000.00 ක ණය මුදලක් වන මෙය ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාවය මත නව නිවසක් ඉදිකිරීම, නිවාස අළුත්වැඩියා කිරීම, නිවාසවලට අමතර කොටසක් එකතු කිරීම වැනි

අරමුණු ඉටු කර ගැනීම සඳහා ලබා දෙනු ඇත. මෙම ණය මුදල වාරික දෙකකින් ලබා දීම සිදු කරනු ලබන අතර වසර 04 ක් තුල අය කර ගැනීමේ පදනමින් 5% ක සේවා ගාස්තුවක් මත ලබා දීම සිදු කරනු ලැබේ.

ඒ අනුව සංසද නිවාස ණය 155 ක් හා ගම්මාන නිවාස ණය 28 වශයෙන් නිවාස ඉදිකර ගැනීම සඳහා ප්‍රතිලාභීන් 183 ක් සඳහා මෙම ණය මුදල් ලබා දීම 2016 වර්ෂයේ දී සිදු කර ඇති අතර ඒ සඳහා රු. 52,025,000.00 ක් රණවිරු සේවා අධිකාරිය වැය දරා ඇත. තවද පැරණි නිවාස ණය ලබා දීම සඳහා රු. 15,420,000.00 ක් ද වැය දරා ඇත.

සංසද සඳහා හා ගම්මාන සඳහා නිවාස ණය බෙදී ගිය ආකාරය පහත පරිදි වේ.

අනු අංකය	පළාත	සංසද නිවාස ණය ප්‍රමාණය
01	මධ්‍යම පළාත	24
02	වයඹ පළාත	21
03	උතුරු මැද පළාත	17
04	සබරගමුව පළාත	27
05	ඌව පළාත	15
06	නැගෙණහිර පළාත	02
07	දකුණු පළාත	11
08	බස්නාහිර පළාත	38
	එකතුව	**155**

අනු අංකය	ගම්මානයේ නම	නිවාස ණය ප්‍රමාණය
01	සාලාව	07
02	පැළැදගොඩ	02
03	ඉබ්බාගමුව	06
04	රඹෑව	04
05	ගල්නෑව	02
06	කැකිරාව	03
07	වතුපිටිවෙල	01
08	වල්බෝතලේ	01
09	උඩුපිල	01
10	මිල්ලෑව	01
	එකතුව	**28**

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)

2.3. හදිසි ආපදාවන්හි දී මූල්‍ය ආධාර ලබා දීම

රණවිරු සංසද සාමාජිකත්වය වෙත නාය යෑම්, සුළි සුළං, ගිණි ගැනීම් , ජල ගැලීම් වැනි හදිසි ආපදා තත්වයකදි ඔවුන් වෙත යම් සහනයක් ලබා දීමේ අරමුණින් මෙම ආධාර ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව ඔවුන් වෙත සිදු ව ඇති හානිය පිළිබඳ කරනු ලබන ඉල්ලීම් ලිපියක් මඟින් මෙම ආධාර මුදල ලබා ගැනීම සඳහා ඉදිරිපත් විය හැකිය.

මෙම ආධාර ක්‍රමය යටතේ රු. 25,000.00 ක මුදලක් කඩිනමින් ලබා දී රණවිරු පවුල වෙත යම් සහණයක් සැලසීම මෙමඟින් අපේක්ෂා කෙරේ. ඒ අනුව 2016 වර්ෂයේ 194 දෙනෙකු සඳහා ප්‍රතිලාභ හිමි කර දී ඇත. ඒ යටතේ 2016 වර්ෂයේ සිදු වූ හදිසි ගං වතුර ගැලීම, සලාව ප්‍රදේශයේ සිදු වූ පිපිරීම හේතුවෙන් රණවිරු ගම්මානයේ රණවිරු පවුල් වෙත සිදු වූ හානිය, වැනි ආපදාවන් සඳහා ක්ෂණික ලෙස රණවිරු පවුල් වෙත සහන සැලසීමට හැකියාව මෙම ආධාර ක්‍රමය මඟින් සිදු කරන ලදි.

ඒ අනුව මේ සඳහා රු. 5,306,411.00 ක මුදලක් වැය දරා ඇත.

2.4. ඉඩම් ලබා දීම

රණවිරු සේවා අධිකාරියේ කාර්යභාරය රණවිරුවන් හා එම පවුල් සඳහා ඉටුකිරීමේදී වඩාත් විශේෂ වූ හා සංකීර්ණ වූ අංශයක් ලෙස අදාල පවුල් සඳහා වාසස්ථානයක් සපයාදීම දැක්විය හැකිය.

එහෙත් බොහෝ විට නිවාස හා සහණ ණය ව්‍යාපෘතින් මාර්ගයෙන් අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයා පදිංචියට නිවසක් සඳහා දිරිදුන්නද එම නිවාස ගොඩනැඟීම සඳහා ස්ථානයක් (ඉඩමක්) හිමි ව නැති අවස්ථාවන් වලදී රණවිරුවා හා එම පවුල් මහත් අසීරුතාවයකට පත්වේ. තවද ඉඩමක් නොමැති වීම වෙනත් සුබ සාධන අවශ්‍යතාවයන් ලබා ගැනීම සඳහා බාධාවක් ද වනවා ඇත.

ඒ අනුව මෙම ව්‍යාපෘතිය තුලින් සෘජුව ඉඩම් කැබලි ලබාදීම හා වක්‍රව ඉඩම් ලබා ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම සිදු කරනු ලබයි. ඒ අනුව මෙහි අරමුණු පහත පරිදි දැක්විය හැකිය .

- ✓ ඉඩම් නොමැති රණවිරුවන් හා එම පවුල් හඳුනා ගැනීම
- ✓ රණවිරුවන් වෙත බෙදාදිය හැකි රජයේ හෝ වෙනත් ඉඩම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හඳුනාගැනීම හා බෙදාදීමට සුදුසු තත්ත්වයට ගෙන එම
- ✓ රණවිරුවන් වෙත බෙදා දීමට නියමිත ඉඩම් සංවර්ධනය කිරීම
- ✓ රජයේ ඉඩම් වල අනවසරයෙන් පදිංචි වී ඇති රණවිරුවන් සඳහා රණවිරු පදනම මත ඔප්පු/ බලපත්‍ර ලබා ගැනීමට සහය වීම
- ✓ රණවිරුවන් පදිංචි ඉඩම් ගැටළු නිරවුල් කිරීමට සහය වීම

ඉඩම් නොමැති රණවිරුවන් හා එම පවුල් සංසඳ මාර්ගයෙන් හඳුනාගැනීම ඒ අනුව ඔවුන් විසින් කරනු ලබන ඉල්ලීම මත අයදුම්පත් කැඳවීම මඟින් ප්‍රතිලාභීන් තෝරා ගැනීම මෙහි ක්‍රමවේදය වේ. ඒ අනුව 2016 වර්ෂයේ රු. 179,885.00 ක මුදලක් ප්‍රථිලාභ ලබා දීම සඳහා රණවිරු සේවා අධිකාරිය වැය දරා ඇත. එහි ප්‍රගතිය පහත පරිදි වේ.


ප්‍රතිලාභය	ඉලක්කය	ප්‍රගතිය
ඉඩම් කොටස් ලබා දීම. (අප අධිකාරිය වෙත ලැබී ඇති ඉඩම් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මහවැලි අධිකාරිය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් සඳහා)	100	48
ඉඩම් කොටස් ලබාදීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම ප්‍රදේශය ලේකම් කාර්යාලය/ මහවැලි අධිකාරිය		42
රජයේ ඉඩම් වල පදිංචි රණවිරුවන් සඳහා ඔප්පු/ බලපත්‍ර ලබා දීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.	ඉල්ලීම් මත	199
හඳුනාගත් ඉඩම් සඳහා නාම ලේඛණ ප්‍රාදේශීය ලේකම් කාර්යලය වෙත යොමු කිරීම දඹුල්ල 81 ඉබ්බාගමුව 146 නිකවැරටිය 44 මතුගම පාන්තිය ඉඩම 313 අගුණුකොලපැලැස්ස 129 පොලොන්නරුව 37		750

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)

රණවිරු නිවාස සැපයීම සහ එහි ලා සහාය වීම් වෙනුවෙන් 2016 වර්ෂයේ ප්‍රගතිය කරා ලඟා වීම පහත පරිදි වේ.

රණවිරු නිවාස සැපයීම	2016 භෞතික		2016 මූල්‍ය (රු. මී)	
	ඉලක්කය	ප්‍රගතිය	වෙන්කිරීම	ප්‍රගතිය
නිවාස ආධාර ලබා දීම - නව	25	23	5.00	4.58
නිවාස ආධාර ලබා දීම - පැරණි	67	67		
සංසද නිවාස ණය - නව	133	183	54.10	52.03
සංසද නිවාස ණය - පැරණි	153	158	17.87	15.42
හදිසි ආපදාවන්හි දී මූල්‍ය ආධාර	171	194	5.35	5.30
ඉඩම් කොටස් ලබා දීම.	100	48	0.50	0.18
ඉඩම් කොටස් ලබාදීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම		42		
රජයේ ඉඩම් වල පදිංචි රණවිරුවන් සඳහා ඔප්පු/ බලපත්‍ර ලබා දීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.	ඉල්ලීම් ලැබෙන පරිදි	199		
හඳුනාගත් ඉඩම් සඳහා නාම ලේඛණ ප්‍රාදේශීය ලේකම් කාර්යලය වෙත යොමු කිරීම		750		

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)



(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)

- 03 -

වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම.

ආබාධිත රණවිරුවන්, ඔවුන්ගේ පවුල් වල ළඟම ඥාතීන් හා දිවි පිදූ, අතුරුදහන් රණවිරුවන්ගේ ළඟම ඥාතීන් කායික හා මානසික වශයෙන් සවිබල ගැන්වීම සඳහා වෛද්‍ය සායන පැවැත්වීම, හදිසි සැත්කම් සඳහා ණය මුදලක් ලබා දීම, ආධාර මුදල් ලබා දීම හා මානසික වශයෙන් ශක්තිමත් කිරීම සඳහා විවිධ වැඩමුළු, වැඩසටහන් පැවැත්වීම මෙමඟින් සිදු කරනු ලැබේ.

3.1. සෞඛ්‍ය වැඩසටහන්

මේ යටතේ වෛද්‍ය සායන හා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩමුළු ලෙස වැඩසටහන් 02 ක් ක්‍රියාත්මක වේ.

3.1.1. වෛද්‍ය සායන



දිවයින පුරා විසිරී සිටින රණවිරු සංසද සාමාජික අබාධිත විශ්‍රාමික රණවිරුවන් ඔවුන්ගේ පවුල් ඥාතීන් හා මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ගේ සෞඛ්‍ය මට්ටම යහපත් කිරීම අරමුණු කොටගෙන වෛද්‍ය සායන පැවැත්වීම මෙම වැඩසටහනින් සිදුකෙරේ.

බොහෝ පුද්ගලයින් වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමුවන්නේ රෝගයක් වැලදුනු පසුවය. ඇතැම් රෝග තත්ත්වයන් මුල් කාලීන අවස්ථාවන්හිදී ප්‍රබල අපහසුතා ඇති නොකළද නිහඬව වර්ධනය වී මාරාන්තික තත්ත්වයක් දක්වා වර්ධනය වේ. උදාහරණ ලෙස දියවැඩියාව, රුධිර පීඩනය, කොලෙස්ටරෝල්, ගැබ්ගෙල පිළිකා, පියයුරු පිළිකා වැනි රෝගයන් දැක්විය හැකිය.

මෙලෙස වෛද්‍ය සායන පැවැත්වීම තුළින් පුද්ගල සෞඛ්‍ය සම්බන්ධ අවදානම් කරුණු කල්තබා හඳුනාගැනීම තුළින් හා අවදානම් සාධක පිළිබඳව දැනුවත් කිරීම මඟින් රෝග ඇතිවීමට ඇති අවස්ථා අවම කර ගැනීමටත් පවතින රෝග තත්ව උග්‍රවීම වලකා ගැනීමටත් හැකිවේ.

අනු අංක	සායනය පැවැත් වූ ස්ථානය	සායනය පැවැත් වූ දිනය	සායනය සඳහා සහභාගී වූ ප්‍රමාණය
01	සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානය - අඹේපුස්ස	2016.06.28	257
02	නගර ශාලාව - මාතලේ	2016.08.16	275
03	නාතිස්ස රජ මහා විහාරය - නාවුල	2016.08.23	286
04	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කොත්මලේ	2016.10.18	211

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)

3.1.2. සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩමුලු



අබාධිත විශ්‍රාමික රණවිරුවන් ඔවුන්ගේ පවුල් ඥාතීන් හා මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ගේ සෞඛ්‍ය ගැටලු අධ්‍යනය කිරීමේ දී ඔවුන්ගේ සෞඛ්‍ය දුර්වලවීම සඳහා සෘජු දායකත්වයක් ඔවුන් ගන්නා ආහාර හා ඇවතුම් පැවතුම් වල ඇති වැරදි භාවිතාව නිසා සිදුවන බව පෙනී ගොස් ඇත.

පෝෂණය හා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක රණවිරුවන් හා ඔවුන්ගේ ඥාතීන් තුළ පෝෂණය හා සෞඛ්‍ය යහපත් තත්ත්වයෙන් පවත්වාගෙන යමින් රෝග වලට ගොදුරු නොවී සිටින්නේ කෙසේද යන දැනුම ඔවුන් වෙත ලබාදීම සඳහාය. මෙහිදී දේශන හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් යොදා ගනිමින් සිදුකරන අතර 2016 වර්ෂයේ වැඩසටහන් 07 ක් ක්‍රියාත්මක කර ඇත.

අනු අංක	සායනය පැවැත් වූ ස්ථානය	සායනය පැවැත් වූ දිනය	සායනය සඳහා සහභාගී වූ ප්‍රමාණය
01	කඩවත් සතර ප්‍රා.ලේකම් කාර්යාලය - ගාල්ල	2016.08.10	67
02	YIA ශාලා පරිශ්‍රය - මාතර	2015.08.09	59
03	අම්බලන්තොට ගිරිහඬු විහාරයීය පරිශ්‍රය	2016.08.08	48
04	බම්බාව රජ මහා විහාරය - ගලේවෙල	2016.09.27	120
05	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කොත්මලේ	2016.10.18	211
06	වලිසිංහ හරිස්චන්ද්‍ර මහා විද්‍යාලය - අනුරාධපුර	2016.12.22	103
07	රාජකීය විද්‍යාලය - පොළොන්නරුව	2016.12.27	81

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)

3.2. වෛද්‍ය ආධාර ලබාදීම

රණවිරු ප්‍රජාවේ සෞඛ්‍ය ගැටලුවලට ප්‍රතිකාර ලබාදීමට මූල්‍යමය හෝ ද්‍රව්‍යමය වශයෙන් සහාය වීම අරමුණු කරගනිමින් ක්‍රියාත්මක වන මෙම ආධාර ක්‍රමය ක්‍රියාන්විත හේතූන් මත ආබාධිත විශ්‍රාමික තත්ත්වයට පත්ව රෝගාබාධයන්ට ලක්වූ රණවිරුවන්, ඔවුන්ගේ පවුල් වල ළඟම ඥාතීන් සහ දිවිපිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ගේ වෛද්‍ය ප්‍රතිකාර කටයුතු සඳහා සහාය වීම මෙම වැඩසටහන වෙතින් සිදු කෙරේ.

මේ යටතේ හදිසි සැත්කම් සඳහා ආධාර කිරීම, වෛද්‍ය පරීක්ෂණ සඳහා සහායවීම, රෝග තත්වයන් මහහරවා ගැනීමට අත්‍යවශ්‍ය වන වෛද්‍ය උපකරණ ලබාදීම, ආර්ථික අපහසුතාවයෙන් පෙලෙන ඉල්ලුම්කරුවන්ට ප්‍රතිකාර ගැනීම සඳහා සහයවීම ආදී කාර්යන් සඳහා සහය ලබාදීම සිදුකරයි. ඒ අනුව 2016 වර්ෂයේ දී නව ප්‍රතිලාභීන් සඳහා ආධාර 65 ක් හා පැරණි වාරික ගෙවීම් 425 ක් සඳහා ආධාර මුදල් ගෙවීම සිදු කර ඇති අතර රණවිරු සේවා අධිකාරිය විසින් 3,097.631.00 ක මුදලක් ඒ සඳහා වැය දරා ඇත.

3.3. වෛද්‍ය ණය ලබාදීම

මාසික වැටුප් හිමිගැන්වෙන ක්‍රියාන්විත හේතූන් මත ආබාධිත විශ්‍රාමික තත්ත්වයට පත්ව රෝගාබාධයන්ට ලක්වූ රණවිරුවන්, ඔවුන්ගේ පවුල් වල ළඟම ඥාතීන් සහ දිවිපිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ගේ වෛද්‍ය ප්‍රතිකාර කටයුතු සඳහා සහාය වීම මෙම වැඩසටහන වෙතින් සිදු කෙරේ.

මේ යටතේ හදිසි සැත්කම් සඳහා ආධාර කිරීම, වෛද්‍ය පරීක්ෂණ සඳහා සහායවීම, රෝග තත්වයන් මගහරවා ගැනීමට අත්‍යවශ්‍ය වන වෛද්‍ය උපකරණ ලබාදීම සිදුකරනු ලබන අතර ලබාදෙනු ලබන ණය මුදල 2.5% සේවා ගාස්තුවක් සමඟ නැවත අයකරගනී. 2016 වර්ෂයේ ප්‍රතිලාභීන් දෙදෙනෙකු සඳහා (02) සඳහා ණය මුදල් ලබා දීම සිදු කර ඇති අතර රු. 200,000.00 ක මුදලක් රණවිරු සේවා අධිකාරිය වැය දරා ඇත.

3.4. රණවිරු දරු ප්‍රථමාධාර පුහුණු වැඩමුළුව



ස්වභාවික හා මිනිසා විසින් නිර්මිත ආපදා තත්වයන්හි දී ඒවා හඳුනාගැනීම, ක්ෂණිකව ක්‍රියාකිරීම, සෞඛ්‍ය මැදිහත්කරණය සඳහා වූ පුහුණුවක් නොමැති කම නිසා සිදුවන අනතුරෙහි තත්ත්වය සංකීර්ණ වන අවස්ථා සුලබය.

දෛනික ජීවිතයේ දී මුහුණදීමට සිදුවන අනතුරු හා විවිධ ආපදා තත්ත්වයන්හි දී ඒවාට සාර්ථකව මුහුණ දීමටත්, ප්‍රජාවේ අන් අයට උපකාර වීමට හැකි අයුරින් වයස අවුරුදු 12 – 21 අතර රණවිරු දූ දරුවන් සඳහා පිළිගත් ක්‍රමවේදයන්ට අනුව ප්‍රථමාධාර පුහුණුවක් ලබාදීම මේ යටතේ සිදු කෙරේ.

ඒ අනුව 2016 වර්ෂයේ ප්‍රථමාධාර පුහුණු වැඩමුළු 04 ක් පවත්වා ඇති අතර ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

අනු අංක	වැඩමුළුව පැවැත් වූ ස්ථානය	වැඩමුළුව පැවැත් වූ දිනය	වැඩමුළුව සඳහා සහභාගී වූ ප්‍රමාණය
01	ශාස්ත්‍රානන්ද පිරිවෙන - පිළියන්දල	2016.12.27,28,29	29
02	රණවිරු ගම්මාන පරිශ්‍රය - වතුපිටිවල	2016.08.23,24,25	35
03	වලිසිංහ හරිස්චන්ද්‍ර මහා විද්‍යාලය - අනුරාධපුර	2016.12.22,23,24	33
04	රාජකීය විද්‍යාලය - පොළොන්නරුව	2016.12.26,27,28	32

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)

3.5. සිත්සුවය වැඩමුළුව




මානසික අක්‍රමිකතාවන්ගෙන් පෙළෙන රණවිරුවන්, සංසද සාමාජිකයින් පිළිබඳව සොයා බලා අවශ්‍ය මනෝ ප්‍රතිකාර, ඖෂධ ප්‍රතිකාර ලබාදීමත් මනෝ උපදේශන කටයුතු සඳහා යොමු කිරීමත් මෙම වැඩසටහන යටතේ සිදු කෙරේ.

අක්‍රමිකතාවයෙන් පෙළෙන පුද්ගලයා හෝ රණවිරු ඥාතියෙකු විසින් අංශය දැනුවත් කිරීමෙන් අනතුරුව අවශ්‍ය සේවා සැපයීම සිදුකරනු ලබන අතර කණ්ඩායම් උපදේශන කටයුතු සිදුකරමින් උපදේශන හා මනෝ ප්‍රතිකාර ඇවැසි සාමාජිකයින් හඳුනාගනු ලැබේ. සිත් සුවය වැඩමුළුව යටතේ 2016 වර්ෂයේ වැඩමුළු 03 ක් පවත්වන ලදි.

2016 වර්ෂය තුල වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම වෙනුවෙන් රණවිරු සේවා අධිකාරියේ සමස්ත ප්‍රගතිය පහත පරිදි වේ.

වෛද්‍ය පහසුකම් සැපයීම	2016 භෞතික		2016 මුල්‍ය (රු. මී)	
	ඉලක්කය	ප්‍රගතිය	වෙන්කිරීම	ප්‍රගතිය
සෞඛ්‍ය වැඩසටහන්	07	12	6.63	6.62
වෛද්‍ය ආධාර ලබා දීම - නව	80	65	3.28	3.10
වෛද්‍ය ආධාර ලබා දීම - පැරණි	480	425		
වෛද්‍ය ණය ලබා දීම	20	02	0.50	0.20
රණවිරු දරුවන් සඳහා ප්‍රථමාධාර පුහුණු වැඩසටහන්	02	04	0.60	0.44
සිත් සුවය	03	03		

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)



(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)

- 04 -

අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාව සැලසීම

6 වසරේ සිට අ.පොෙ.ස සා/පෙළ දක්වා අධ්‍යාපනය ලබන දරුවන්ට ,විශ්වවිද්‍යාල, විද්‍යාපීඨ හා වෙනත් උසස් අධ්‍යාපන ආයතන වෙත තේරී පත් වන රණවිරු දරුවන්ට ශිෂ්‍යත්ව ක්‍රියාත්මක කිරීම, 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් වන දරුවන් ඇගයීම හා පුද්ගලික ආර්ථික අපහසුතා ඇති දරු දැරියන් හට අධ්‍යාපන ශිෂ්‍යත්ව ආධාර මාසිකව ලබා දීම මෙමගින් සිදු කරනු ලැබේ.

4.1. අධ්‍යාපන ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය



දේශයේත් ජනතාවගේත් ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියාන්විත සේවයේ නියුතුව සිය ජීවිතය පූජා කරන ලද, ආබාධිත විශ්‍රාමික වූ හා දැනට ආබාධිතව සේවයේ නියුතු රණවිරුවන්ගේ දරු දැරියන්ගේ අධ්‍යාපන කටයුතු අතරමඟ නතර නොවී උසස් අධ්‍යාපනය දක්වා සාර්ථක කර ගැනීමට දිරි දීමක් වශයෙන් හා උසස් අධ්‍යාපනය සඳහා තේරීපත්වූ දරුවන් ඇගයීමක් වශයෙනුත් හා ඔවුනට ආර්ථික ශක්තියක් වෙමින් රටක වගකීම ඉටු කිරීමට දායක වීම සඳහා රණවිරු සේවා අධිකාරියේ අධ්‍යාපන ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

මෙහි ඉලක්ක ගත කණ්ඩායම ලෙස ක්‍රියාන්විත සේවයේදී තම ජීවිත පරිත්‍යාග කල හා ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන්ගේ,

- 06 ශ්‍රේණියේ සිට 09 ශ්‍රේණිය දක්වා පාසල් අධ්‍යාපනය හදාරණු ලබන රණවිරු දරුවන් .
- අ.පො.ස උ/පෙළ හදාරණු ලබන රණවිරු දරුවන්.
- උසස් අධ්‍යාපනය හදාරනු ලබන රණවිරු දරුවන්

ඒ අනුව මේ යටතේ ක්‍රියාත්මක ශිෂ්‍යත්ව ක්‍රම හා වැඩසටහන් පහත පරිදි වේ.

4.1.1. රණවිරු දු දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව ක්‍රමය

2005 වසරේ සිට ආරම්භ කෙරුනු මෙය ජාතික ඉතිරිකිරීමේ බැංකුව හා අනුබද්ධිතව රණවිරුවන්ගේ 6 වසරේ සිට අ.පො.ස සා/පෙළ දක්වා අධ්‍යාපනය ලබන දු දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක වේ. මෙම දරුවන්ගේ අ.පො.ස සා/පෙළ හා උ/පෙළ අධ්‍යාපන සඳහා රුපියල් 12,000/- ක ඉතුරුම් මුදලක් ලැබෙන සේ මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලැබේ. 2016 වර්ෂයේදී රණවිරු දු දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ නව ශිෂ්‍යත්ව 821 ක් ලබා දීම සිදු කරන ලදි.

4.1.2. අ.පො.ස උ.පෙළ ශිෂ්‍යත්ව ක්‍රමය

රණවිරුවන්ගේ අ.පො.ස උ/පෙළ පංති වල අධ්‍යාපනය ලබන දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක මෙම ශිෂ්‍යත්ව ක්‍රමයේ දී රණවිරු දු දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ ශිෂ්‍යත්ව ලාභියෙකු නොවූ දරුවෙකු සඳහා අ.පො.ස සා/පෙළ පංතියේ දී ද නැතහොත් අ.පො.ස සා/පෙළ හොදින් සමත් වී අ.පො.ස උ/පෙළ සඳහා තේරී පත් වූ විට මසකට රු. 500 බැගින් උපරිම වසර දෙකක් ලබාදේ. ඒ අනුව 2016 වර්ෂයේ දී ශිෂ්‍යත්ව 253 ක් මෙම ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ ලබා දීම සිදු කරන ලදි.

4.1.3. උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර

මෙම ශිෂ්‍යාධාර ක්‍රමයෙන් අ.පො.ස උ/පෙළ හොදින් සමත්වී එහි ප්‍රතිඵල මත විශ්ව විද්‍යාල, විද්‍යාපීඨ හා වෙනත් උසස් අධ්‍යාපන ආයතන වල අධ්‍යාපනය සඳහා වරම් ලබන දරුවනට මසකට රු.2000/- බැගින් ඔවුන්ගේ අධ්‍යයන කාලය ඉදිරියට උපරිම අධ්‍යයන වර්ෂ 4ක් ඇතුලත් වනසේ වාරික 40ක් මෙම ශිෂ්‍යාධාර පිරිනමනු ලැබේ. 2016 වර්ෂයේදී උසස් අධ්‍යාපනය ලබන දරුවන් 58 දෙනෙකු සඳහා ශිෂ්‍යාධාර ලබා දීම සිදු කරන ලදි.

4.1.4. 5 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන් ඇගයීම

රණවිරුවන්ගේ 5 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන්ගේ ඉදිරි අධ්‍යාපන කඩඉම් ජය ගැන්වීමට දිරිගැන්වීමක් ලෙස හා ඉදිරි 5 වසර ශිෂ්‍යත්වයට පෙනී සිටින දරුවන් දිරිමත් කිරීමේ අරමුණින් 5 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන් වෙනුවෙන් විශේෂ ඇගයීමක් සිදුකිරීම මෙමඟින් සිදු කරනු ලබන අතර එක් දරුවෙකුට රු 20000 බැගින් එකවර මුදලක් ගෙවීම හා සහතික පත්‍රයක් ලබාදීම මේ යටතේ සිදු කරනු ලැබේ. ඒ අනුව 2016 වර්ෂයේදී 5 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන් 105 දෙනෙකු ඇගයීම සිදු කරන ලදි.

4.1.5. ශිෂ්‍යත්ව ප්‍රධානෝත්සව පැවැත්වීම

2016 වර්ෂයේදී මෙම අධ්‍යාපන ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය ආරම්භ කරන ලද ශිෂ්‍යත්ව පළාත්/ දිස්ත්‍රික් වශයෙන් එම ශිෂ්‍යත්වලාභී දරුවන් කැඳවා ඔවුන් වෙත ලබාදීම පහත පරිදි සිදු කරන ලදි.

අ.අ	පළාත / දිස්ත්‍රික්කය	දිනය	ලබාදුන් ශිෂ්‍යත්ව ප්‍රමාණය
01	පොළොන්නරුව	2016.06.20	17
02	සබරගමු පළාත	2016.08.29	59
03	කොළඹ	2016.09.08	48
04	කළුතර	2016.09.09	56
05	මධ්‍යම පළාත	2016.09.13	108
06	ගම්පහ	2016.09.15	78
07	අම්පාර	2016.09.19	33
08	ත්‍රිකුණාමළය	2016.09.21	15
09	ඌව පළාත	2016.09.22	71
10	අනුරාධපුර	2016.09.29	145
11	වයඹ පළාත	2016.11.29	200
12	ගාල්ල	2016.12.06	83

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)

4.2. මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය



දේශයේ සුරක්ෂිතතාවයත් ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් ත්‍රිවිධ හමුදාවේ සහ පොලිස් සේවයේ නියුතු රණවිරුවන් තම ජීවිත පරිත්‍යාගයෙන් යුතුව ඉටු කල සේවයට කෘතවේදීත්වය පුද කරනු වස් එම රණවිරුවන්ගේ දු දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමට රුකුල් දීමක් ලෙස මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය මගින් ශිෂ්‍යත්ව පිරිනමනු ලැබේ. රණවිරු සේවා අධිකාරියේ මුදල් යෙදවීම මත හා දේශීය,විදේශීය පරිත්‍යාගශීලීන්ගේ මූල්‍යමය දායකත්වය මත ශිෂ්‍යත්ව පිරිනැමීම සිදු කරනු ලැබේ.මාසිකව රු.500/= ක මුදලක් ශිෂ්‍යත්වලාභීන් වෙත ලබා දෙනු ලබන අතර අ.පො.ස (උ පෙළ) විභාගය වෙත ඉදිරිපත් වන තෙක් ශිෂ්‍යාධාර මුදල් ගෙවීම සිදු කෙරේ.එම කාලය අතරතුර කැපකරු මාපියන් ලෙසින් දරුවන්ගේ අධ්‍යාපනයට අතහිත දීමට බලාපොරොත්තු වන දේශීය හා විදේශීය පරිත්‍යාගශීලීන්ගේ ආධාර දරුවන්

වෙත ලබා ගැනීමට අවශ්‍ය සිදු කරනු ලැබේ.එතැන් සිට එම පරිත්‍යාගශීලීන්ගේ ආධාර දරුවන් වෙත ලබා දෙනු ලැබේ. ඒ අනුව මෙහි ඉලක්ක කණ්ඩයාම පහත පරිදි වේ.

- ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය හා ආබාධිත තත්වයට පත් වූ රණවිරුවන්ගේ දරුවන්
- සියලුම රණවිරුවන්ගේ විශේෂ අධ්‍යාපනය හදාරන දරුවන්
- අධ්‍යාපන කටයුතුවල නිරත දීර්ඝකාලීන රෝගී තත්වයන්ගෙන් පෙළෙන රණවිරු දරුවන්

2016 වර්ෂයේදී රණවිරු සේවා අධිකාරියේ මුදල් යෙදවීම මත හා පරිත්‍යාගශීලීන්ගේ ආධාර මත අලුතින් ආරම්භ කරන ලද ශිෂ්‍යත්ව ප්‍රමාණය 189 ක් වන අතර එහි විස්තර පහත පරිදි වේ.

අනු අංකය	මාසය	අධිකාරියේ මුදල් යෙදවීම මත ආරම්භ කරන ලද ශිෂ්‍යත්ව ප්‍රමාණය	පරිත්‍යාගශීලීන්ගේ ආධාර මගින් ආරම්භ කරන ලද ශිෂ්‍යත්ව ප්‍රමාණය
01	ජනවාරි	11	-
02	පෙරවාරි	-	100
03	මාර්තු	13	-
04	අප්‍රේල්	-	01
05	මැයි	-	-
06	ජුනි	20	-
07	ජූලි	07	02
08	අගොස්තු	07	-
09	සැප්තැම්බර්	05	-
10	ඔක්තෝබර්	04	-
11	නොවැම්බර්	13	-
12	දෙසැම්බර්	05	01
	එකතුව	85	104

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)

ඒ අනුව 2016 වර්ෂයේදී ලබා දෙන ලද මුළු මාපිය කැපකරු ශිෂ්‍යත්ව ප්‍රමාණය පහත පරිදි වේ.

අනු අංකය	මාසය	අධිකාරියේ මුදල් යෙදවීම මත ලබා දෙන ලද ශිෂ්‍යත්ව ප්‍රමාණය	පරිත්‍යාගශීලීන්ගේ ආධාර මගින් ලබා දෙන ලද ශිෂ්‍යත්ව ප්‍රමාණය	මුළු එකතුව
01	ජනවාරි	710	76	786
02	පෙබරවාරි	616	83	699
03	මාර්තු	632	77	709
04	අප්‍රේල්	633	161	794
05	මැයි	583	162	745
06	ජුනි	603	162	765
07	ජූලි	608	164	772
08	අගෝස්තු	554	159	713
09	සැප්තැම්බර්	554	164	718
10	ඔක්තෝබර්	562	161	723
11	නොවැම්බර්	573	161	734
12	දෙසැම්බර්	576	162	738

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)

මීට අමතර වශයෙන් මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය මඟින් පහත සේවාවන් ද 2016 වර්ෂයේදී සිදු කරන ලදි.

1. පිළිකා රෝගී තත්ත්වයකින් පෙළෙන රණවිරු බිරිඳකගේ ප්‍රතිකාර කටයුතු සඳහා රු.50,000/- ක මුදලක් පරිත්‍යාගශීලීන් ආධාර මඟින් ලබා දීමට කටයුතු කර ඇත.

2. ඉහත රණවිරු බිරිඳකගේ රෝගී තත්ත්වය සඳහා ලබා දියු යුතු එන්නත් 12 කින් එන්නත් 03 ක් සඳහා වැය වන මුදල් පරිත්‍යාගශීලීන්ගේ ආධාර මඟින් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී. එම එක් එන්නතක මිල රු.250,000/- ක් වන අතර ඉහත රණවිරු බිරිඳගේ ඉදිරි ප්‍රතිකාර කටයුතු සඳහා ද මූල්‍යමය පරිත්‍යාගයන් පරිත්‍යාගශීලීන් විසින් ලබා දෙන ලදී.

3. ඉන්ෆොමැටික් ආයතනය මඟින් රු.1,500,000/- ක් පමණ වටිනා පාඨමාලා 03 ක් සඳහා රණවිරු දරුවන් 05 දෙනෙකු සඳහා නොමිලේ හැදෑරීමට අවස්ථාව ලබා දුන් අතර ඒ සඳහා පැවැත් වූ තෝරා ගැනීමේ පරීක්ෂණයට ව්‍යාපෘතිය යටතේ ශිෂ්‍යාධාර ලබා ගත් දරුවන් යොමු කරන ලදී.

4. කුවේට් ශ්‍රී ලංකා එකමුතුව මඟින් ආර්ථික අපහසුතා ඇති රණවිරු දරුවන් රණවිරු දරුවන් සිය දෙනෙකු වෙත ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට ඉදිරිපත් වූ අතර එම ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය නාවික හමුදා මුලස්ථාන ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

4.3. හදුනාගත් වෘත්තිමය හා අධ්‍යාපනික කුසලතා වෙනුවෙන් මූල්‍ය සහන ලබාදීම.

මේ යටතේ කේෂත්‍රයන් 02 ක් ඔස්සේ මූල්‍ය සහන ලබා දීම සිදු කරනු ලැබේ.

4.3.1. අධ්‍යපන වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා අර්ධ ශිෂ්‍යත්ව ලබාදීම

රණවිරු පවුල්වල දුදරුවන්ගේ කාර්මික හා තාක්ෂණික අධ්‍යාපනික හා වෘත්තීය නිපුණතාවයන් වැඩි දියුණු කොට ඔවුන් ඉදිරි අනාගතයේදි සාර්ථක වෘත්තීයක් කරා යොමු කරවීමේ අරමුණු පෙරදැරි කරගනිමින් රණවිරු සේවා අධිකාරියේ නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් අධ්‍යාපන වෘත්තීය පාඨමාලා සඳහා අර්ධ ශිෂ්‍යත්ව ලබාදීම පෙර වසරේදී මෙන්ම මේ වසර තුළදී සිදු කරන ලදි.

මේ යටතේදී ලංකාවේ පිළිගත් ආයතන මඟින් සිදුකරනු ලබන ඕනෑම පාඨමාලාවක් හැදෑරීම සඳහා එම පාඨමාලා ගාස්තුවෙන් (මුදල රු.50,000.00 ක උපරිමයකට යටත්ව)අඩක් අප අධිකාරිය මඟින් ගෙවීම් සිදුකරනු ලැබේ. ඒ අනුව 2016 වර්ෂය අවසානය වන විට 28 දෙනෙකු සඳහා අර්ධ ශිෂ්‍යත්ව ලබා දෙන ලදි.


4.3.2. විදේශීය හා දේශීය ක්‍රීඩා තරඟ හා අධ්‍යාපන කටයුතු වලට සහභාගී වීම වෙනුවෙන් ආධාර ලබාදීම.

තම දේශය වෙනුවෙන් තම ජීවිතය පූජා කල හා දැනට සේවයේ යෙදි සිටිමින් තම මෙහෙවර නිබඳව රට වෙනුවෙන් ලබා දෙන රණවිරුවන්ගේ පවුල්වල ලගම ඥාතීන් (දුව /පුතා/බිරිඳ) වෙතත් රණවිරුවා අවිවාහකයකු නම් දෙමාපියන්ටත්/අවිවාහක සහෝදර සහෝදරියන්ටත් ඔවුන්ගේ දස්කම් අනුව රටට කිර්තියක් ගෙන දිමේ අරමුණු ඇතිව ජාත්‍යන්තර මට්ටමේ තරග සඳහා සහභාගී වීම වෙනුවෙන් ආධාර ලබාදීම සිදුකර ඇත. 2016 වර්ෂයේ ප්‍රතිලාභීන් 12 දෙනෙකු සඳහා ආධාර ලබාදී ඇත.

2016 වර්ෂය තුල අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථා සැලසීම වෙනුවෙන් සමස්ත ප්‍රගතිය පහත පරිදි වේ.

අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාව සැලසීම	2016 භෞතික		2016 මුල්‍ය (රු. මී)	
	ඉලක්කය	ප්‍රගතිය	වෙන්කිරීම	ප්‍රගතිය
රණවිරු දු දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව - නව	700	821	22.42	22.25
රණවිරු දු දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව - පැරණි	560	560		
අ.පොස උ.පෙළ ශිෂ්‍යත්ව - නව	350	253		
අ.පොස උ.පෙළ ශිෂ්‍යත්ව - පැරණි	389	389		
උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර - නව	50	58		
උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර - පැරණි	139	139		
5 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන් ඇගයීම	105	105		
මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය - නව	144	85		
මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය - පැරණි	700	700		
හදුනාගත් වෘත්තිමය හා අධ්‍යාපනික කුසලතා වෙනුවෙන් මූල්‍ය සහන ලබාදීම.	15	40	1.9	1.89

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)



- 05 -

ඵලදායී සේවානියුක්තියක් සුරක්ෂිත කිරිමෙහි ලා සහාය වීම.

රණවිරුවන්ගේ ආර්ථික අපහසුතා මඟහරවා ගැනීම සඳහා මාසිකව මුදලක් ලබා දීම හා විශේෂ ආර්ථික අපහසුතා ඇති රණවිරු මව්පියවරුන් සඳහා විශේෂ මූල්‍ය ආධාර මාසිකව සිදු කිරීම, ශ්‍රම බලකාය තුල සිටින රණවිරු ඥාතීන් ඵලදායී ලෙස කාර්යයක නියුක්ත කිරීම සඳහා ස්වයං රැකියා සඳහා යොමු කිරීම මෙමඟින් සිදු කරනු ලැබේ.

5.1. ස්වයං රැකියා ණය ලබා දීම

දිවිපිදූ, අතුරුදහන් හා ආබාධිත විශ්‍රාමික රණවිරු පවුල්වල ස්වයං රැකියාවක් ආරම්භ කිරීම හා වැඩි දියුණු කරගැනීම සඳහා පහසුකම් ලබාදීම මේ යටතේ සිදු කෙරේ. එහිදි ප්‍රතිලාභියෙකුට හිමිවන ණය මුදල රු. 200,000.00 ක් වන අතර 5% ක සේවා ගාස්තුවක් මේ සඳහා අයකරනු ලැබේ.

2016 ස්වයං රැකියා ණය ලබාදීමේ ඉලක්කය 15 ක් වූ අතර 2016 අවසන් වන විටදී ප්‍රතිලාභීන් 16 දෙනෙකු සඳහා ස්වයං රැකියා ණය ලබා දීමට හැකිවිය. එම ආධාර ලබා දීම පළාත් මට්ටමින් පහත පරිදි වේ.

දකුණු පළාත	මධ්‍යම පළාත	බස්නාහිර පළාත	වයඹ පළාත	ඌව පළාත
03	02	01	08	02

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)

5.2. රණවිරු මාපිය සුරකුම් වැඩසටහන

ක්‍රියාන්විත හේතූන් මත දිවිපිදූ අවිවාහක රණවිරුවන්ගේ දෙමාපියන් වෙත වැටුප් හා සියලු දීමනා ලබා දීම සිදු කරන අතර විවාහක රණවිරුවන්ගේ දෙමාපියන් හට 2007.11.21 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුපෙන් 25% ක දීමනාවක් ලබා දීම සිදු කෙරේ. ඒ අනුව එම දිනට පෙර ජීවිත පරිත්‍යාග කල රණවිරුවන්ගේ දෙමාපියන් වෙත කිසිදු දීමනාවක් ලබා නොදේ.එය හේතු කොට ගෙන එම දෙමාපියන් සමාජීය,ආර්ථික හා මානසික ලෙස දැඩි පීඩනයකට පත්ව ඇත.

රට වර්තමානයේ පවතින තත්ත්වයට පත් කිරීමට රණවිරුවෙකු රට වෙනුවෙන් පරිත්‍යාග කල ඉහත අසරණ භාවයට පත් රණවිරුවන්ගේ දෙමාපියන් රැක බලා ගැනීම වෙනුවෙන් ඔවුන්ගේ සැදෑ සමය ආර්ථික හා මානසික තෘප්තිමත් භාවයකින් යුතුව ගත කිරීමට හැකි පමණින් ආධාර උපකාර කිරීම සඳහා ක්‍රියාත්මක කෙරෙන සුභසාධන ව්‍යාපෘතියකි. මෙහි ඉලක්ක ගත කණ්ඩායම පහත පරිදි වේ.

- රජයේ විශ්‍රාම වැටුප් නොලබන රණවිරු දෙමව්පියන්,
- ජීවිත පූජා කළ හෝ අතුරුදහන් වූ සිය දරුවන් විවාහක නම් ඒ වෙනුවෙන් බිරිඳට ලැබෙන ප්‍රතිලාභයන්ගෙන් කිසිදු ආර්ථිකමය සහනයක් නොලැබෙන දෙමව්පියන් හා
- රණවිරුවා හැර එම දෙමව්පියන් රැක බලා ගැනීමට වෙනත් දරුවන් හෝ ඥාතීන් නොමැති වීම නිසා අසරණ වූ දෙමව්පියන්ය.

ඒ අනුව දෙමව්පිය දෙදෙනාගෙන් එක් අයෙක් සිටී නම් මාසිකව රු.2,250/- ක් බැගින් හෝ දෙමව්පියන් දෙදෙනාම සිටී නම් එක් අයෙක්ට මාසිකව රු.1,500/- බැගින් රු.3,000/- ක මුදලක් ලබා දීම සිදු කරයි. ඒ අනුව 2016 වර්ෂයේදී නව ප්‍රතිලාභීන් 24 දෙනෙකු සඳහා ආධාර මුදල් ලබා දීම සිදු කරන ලද අතර පැරණි ප්‍රතිලාභීන් 1415 දෙනෙකු සඳහා ආධාර මුදල් ලබා දීම සිදු කරන ලදි. නව ප්‍රතිලාභීන් පළාත් මට්ටමින් බෙදී ගිය ආකාරය පහත පරිදි වේ.

මධ්‍යම පළාත	බස්නාහිර පළාත	දකුණ පළාත	උතුරු මැද පළාත	සබරගමුව පළාත	ඌව පළාත	වයඹ පළාත
08	02	02	04	02	04	02

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)


5.3. රණවිරු මාපිය රැකවරණ ප්‍රතිලාභ

වාර්ෂිකව අයවැයෙන් මුදල් වෙන් කර මාපිය රැකවරණ දීමනාව ලෙස රණවිරු දෙමාපියන් වෙත ලබා දෙනු ලබන දීමනාවකි. මෙමඟින් රු.750.00 දීමනාවක් ක්‍රියාන්විතයේ යෙදී සිටියදී ත්‍රස්තවාදී ප්‍රහාරවලට ලක්වී දිවිපිදූ, අතුරුදහන් හා වෛද්‍ය හේතූන් මත විශ්‍රාම යැවූ රණවිරුවන්ගේ දෙමාපියන් හට පමණක් මාසිකව ගෙවනු ලැබේ. ඒ අනුව 2016 වර්ෂයේ දී රණවිරු දෙමාපියන් 34717 ක් වෙත මෙම දීමනාව ලබා දීම සිදු කරන ලදි.

2016 වර්ෂය තුල ඵලදායී සේවානියුක්තියක් සුරක්ෂිත කිරිමෙහි ලා සහාය වීම වෙනුවෙන් රණවිරු සේවා අධිකාරියේ සමස්ත ප්‍රගතිය පහත පරිදි වේ.

ඵලදායී සේවානියුක්තියක් සුරක්ෂිත කිරිමෙහි ලා සහාය වීම	2016 භෞතික		2016 මුල්‍ය (රු. මී)	
	ඉලක්කය	ප්‍රගතිය	වෙන්කිරීම	ප්‍රගතිය
ස්වයං රැකියා ණය ලබා දීම	15	16	3.00	2.64
රණවිරු මාපිය සුරකුම් වැඩසටහන - නව	1415	1415	32.06	31.57
රණවිරු මාපිය සුරකුම් වැඩසටහන - පැරණි	50	24		
රණවිරු මාපිය රැකවරණ ප්‍රතිලාභ	35,000	34,717	283.50	291.99

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)



(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)

- 06 -

අධිකාරියේ කර්තව්‍යන් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු දෑ කිරීම.

ඒ අනුව රණවිරු ප්‍රජාව ස්වාධිනව නැඟිසිටීම සඳහා අවශ්‍ය දැනුම, අවබෝධය හා ශක්තිය ලබාදෙමින් ආත්ම විශ්වාසය ගොඩනැගීම සඳහා කාලීනව අවශ්‍ය උධෘතයන් ඔස්සේ පුහුණු වැඩමුළු සංවිධානය කිරීම,වීරෝධාර රණවිරුවන්ගේ නාමය සමාජය තුළ අභිමානවත්ව පවත්වාගෙන යාම හා ගෞරවනීය බවට පත්කිරීම සඳහා වාර්ෂිකව ජාතික හා පළාත් රණවිරු සැමරුම සංවිධානය කොට පැවැත්වීම, විරුසර වරප්‍රසාදය හිමිකර දීම, රණවිරු සාහිත්‍යයක් නිර්මාණය සහ ක්‍රීඩාව තුලින් කායිකව හා මානසික සංවර්ධනය මෙමඟින් අපේක්ෂිතය.

6.1. රණවිරු සංසද

රණවිරු පවුල් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව ගොඩනැංවීම තුළින් එම පවුල් වල මනෝ සමාජීය සංවර්ධනය සහ රණවිරු නාමය සදානුස්මරණය කිරීම උදෙසා වූ නිල සන්නිවේදන ජාලය. දිවිපිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් සහ ආබාධිත විශ්‍රාමික රණවිරුවන් සහ ළඟම ඥාතීන් මෙහි ඉලක්ක කණ්ඩායම වේ. තවද මෙම සංසද ජාලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට එක බැඟින් පිහිටුවා ඇත. මෙහි අරමුණු පහත පරිදි වේ.

* සංසද සමිති අඛණ්ඩව ක්‍රියාවට නැංවීම සහ පවත්වා ගෙන යාම.
* සංසද පාලනය සහ යහපැවැත්ම
* නිල සන්නිවේදන ජාලය සහ අන්තර් සම්බන්ධතාවය
* විවිධ වැඩසටහන් සංවිධානය

ඒ අනුව 2016 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී වැඩසටහන් පහත පරිදි දැක්විය හැකි ය.

* සංසද නිලධාරී පුහුණුව
* සංසද නිලධාරී දැනුවත් කිරීම
* සංසද පොකුරු වැඩසටහන්
* සංසද ප්‍රතිසංවිධානය සහ පසු විපරම
* සංසද නිලවරණ පැවැත්වීම
* සංසද මාසික රැස්වීම් හා වැඩසටහන් වලට සහභාගි වීම

6.1.1. දිස්ත්‍රික්ක දැනුවත් කිරීම

දිවි පිදූ, අතුරුදහන් වූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් හා ආබාධිතව විශ්‍රාමලත් රණවිරුවන් හා ඔවුන්ගේ ළඟම ඥාතීන් මාසිකව එක් රැස්කොට ඔවුනොවුන්ගේ අන්‍යෝන්‍ය සහයෝගයෙන් හා අවබෝධයෙන් කටයුතු කරවීමේ ක්‍රමවේදය වන රණවිරු සංසද ස්වේච්ඡා සමිති වෙත කොට්ඨාශයේ රණවිරු පවුල් ඒකරාශි කිරීම හා සංසද ප්‍රාදේශීය වශයෙන් එම තත්ත්වය අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා රණවිරු සංසද රැස්වීම් පැවැත්වීම පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් හා දිස්ත්‍රික් වැඩසටහන් නිළධාරීන් මාර්ගයෙන් සිදු කරනු ලැබේ. මීට අමතර වශයෙන් ඔවුනොවුන්ගේ අන්තර් සංසද සබඳතාවය ඇති කිරීම හා කාර්යය පහසු කරවීමේ අරමුණින් ත්‍රෛයිමාසිකව දිස්ත්‍රික් රැස්වීම් ද පවත්වනු ලබයි. ඒ අනුව 2016 වර්ෂයේ දිස්ත්‍රික් දැනුවත් කිරීම් 19 ක් සිදු කර ඇත.

6.1.2. සංසද පොකුරු වැඩසටහන්

රණවිරු සංසද ව්‍යාපෘතියේ අරමුණු කරා ලඟා වීමට රණවිරු සංසද මඟින් හෝ රණවිරු සංසද සමඟ වෙනත් ආයතන එක්ව සංවිධානය කරනු ලබන වැඩසටහන් සඳහා දායකත්වයක් ලබා දීම මෙම වැඩසටහනෙහි එක් අරමුණක් වේ. සංසද ප්‍රජාව අතර අන්තර් සහයෝගය හා සම්බන්ධතාව ඇති කිරීම, සංසද ක්‍රියාවලිය ශක්තිමත් කිරීම,සංස්කෘතික සාමාජීය,සාහිත්‍යමය,ආර්ථිකමය වශයෙන් වටිනාකමක් ඇති වැඩසටහන් සංවිධානය හා ක්‍රියාවට නැංවීම. ඒ අනුව එය පොකුරු වැඩසටහනක් ලෙස හඳුන්වන අතර සම්පූර්ණ වැඩසටහන සංවිධානය කිරීම රණවිරු සංසද හෝ සංසද මඟින් සම්බන්ධ වන ආයතන මඟින් සිදු කළ යුතුය. ඊට අමතරව වැඩසටහනට වටිනාකමක් ලබා දීම සඳහාත් සංසද ක්‍රියාකාරකම් සඳහා දිරි දීමත් උදෙසා රණවිරු සේවා අධිකාරියේ දායකත්වයක් ලබා දීම සුදුසු බව පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් විසින් තීරණය කරන අවස්ථාවන්හි දී ඒ සඳහා දායකත්වයක් ලබා දීම මෙමඟින් සිදු කෙරේ. ඒ අනුව 2016 වර්ෂයේ සංසද පොකුරු වැඩසටහන් 33 ක් සිදු කර ඇත.

6.2. රණවිරු අනුස්මරණ ව්‍යාපෘතිය

මාතෘභූමියට නිදහස දිනා දෙමින් එය ආරක්ෂා කරන්නාවුත් වීරෝධාර රණවිරුවන්ගේ නාමය අප සමාජය තුළ අභිමානවත්ව පවත්වාගෙන යාම හා ගෞරවනීය බවට පත් කිරීම, සමාජය තුළ රණවිරු නාමය සදානුස්මරණය කිරීම හා අභිමානවත් රණවිරු ප්‍රජාවක් ගොඩනැඟීම අරමුණු කර ගනිමින් මෙය ක්‍රියාත්මක වේ.

මේ යටතේ ජාතික රණවිරු දිනය හා පළාත් උත්සව පැවැත්වීම, මයිලපිටිය රණවිරු උද්‍යානය නඩත්තු කටයුතු හා සංවර්ධන කටයුතු සිදු කිරීම හා යාකබැද්ද වැඩිහිටි නිවාසය සැකසීමේ කටයුතු සිදු කරනු ලැබේ.

6.2.1. ජාතික රණවිරු දින උත්සවය හා පළාත් රණවිරු සැමරුම් උත්සව පැවැත්වීම



ශ්‍රී ලංකා භූමියේ ඒකීයභාවය, ස්වෛරීත්වය හා සියලු ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් තම උතුම් ජීවිතය පරිත්‍යාග කළ අභිත රණවිරු නාමය අනුස්මරණය කිරීම උදෙසාත්, ජාතියේ අභිමානවත් ගෞරවය පුදකිරීම උදෙසාත් මෙය ක්‍රියාත්මක වේ. ඒ අනුව ජාතික රණවිරු දින සැමරුමත්, පළාත් රණවිරු සැමරුම් උත්සවත් 2016 වර්ෂයේද පෙර වර්ෂ වලදී මෙන්ම සිදු කරන ලදි.

2016.05.19 දින බත්තරමුල්ල පාර්ලිමේන්තු ක්‍රීඩාංගනයේ ජාතික රණවිරු සැමරුම් උද්‍යානයේදී අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ත්‍රිවිධ හමුදා, පොලිසිය හා රණවිරු ඥාතීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි. ඊට අමතරව පළාත් රණවිරු සැමරුම් උත්සව පහත සඳහන් පරිදි අභිමානවත්ව හා උත්කර්ශවත් අන්දමින් පවත්වන ලදි.

පළාත	පැවැත් වූ ස්ථානය	පැවැත් වූ දිනය
මධ්‍යම පළාත	මයිලපිටිය රණවිරු ස්මාරකය	2016.05.16
වයඹ පළාත	කුරුණෑගල රණවිරු ස්මාරකය	2016.05.09
උතුරු මැද පළාත	අනුරාධපුර නගර රණවිරු ස්මාරකය	2016.05.12
උතුරු පළාත	පුදුකුඩිඉරිප්පුහි දී	2016.05.10
නැගෙනහිර පළාත	ත්‍රිකුණාමලයේ දී	2016.05.07
ඌව පළාත	බදුල්ල වින්සන්ඩයස් ක්‍රීඩාංගනය අසල රණවිරු ස්මාරකය අසල දී	2016.05.13
සබරගමුව පළාත	රත්නපුර නව නගර රණවිරු ස්මාරකය	2016.05.10
දකුණු පළාත	ගාල්ල නගර මධ්‍ය රණවිරු ස්මාරකය	2016.05.12

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)

6.2.2. මයිලපිටිය උද්‍යානයේ නඩත්තු හා සංවර්ධන කටයුතු

ශ්‍රී ලංකා භූමිය ත්‍රස්තවාදයෙන් මුදවා ගැනීමේදී දිවිපිදූ රණවිරුවන් සිහිකරලීම සඳහා ඉදිවූ ශ්‍රී ලංකාවේ පළමු ජාතික රණවිරු උද්‍යානය මෙය වේ. ආකර්ෂණීය භූමි භාගයක පවත්වා ගෙන යනු ලබන මයිලපිටිය රණවිරු සැමරුම් උද්‍යානයේ දිවි පිදූ රණවිරුවන්ගේ සියළුම නම් ශෛලමය ලේඛන මත සටහන් කොට රණවිරුවන් අනුස්මරණය කිරීම සඳහා ස්මාරකයක් ලෙස ඉදි කොට ඇත.

මෙම උද්‍යානයේ ජලය, විදුලිය හා නඩත්තු සඳහා වැය දැරීම් රණවිරු සේවා අධිකාරිය විසින් සිදු කරනු ලබන අතර ශ්‍රී ලංකා යුධ හමුදාව ඒ සඳහා සහයෝගය ලබා දීම සිදු කරනු ලැබේ.

6.2.3. යාකබැද්ද රණවිරු වැඩිහිටි නිවාසය



මාතෘභූමිය වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කළ ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ රණවිරුවන්ගේ (විවාහක/ අවිවාහක) හවිහරණක් නොමැති අසරණභාවයට පත් දෙමාපියන් පිළිබඳ තොරතුරු වාර්තාවී ඇති අතර ඉන් සමහර මාපියන් තම එකම දරුවා යුද්ධයෙදී ජීවිතය පූජාකළ නිසාවෙන් තම වයෝවෘද්ධ ජීවිතයට පිළිසරණක් නැති සමාජ රැකවරණය අවශ්‍ය තත්ත්වයට පත්ව ඇත.

ඒ අනුව අකුරැස්ස යාකබැද්ද වැඩිහිටි නිවාසය නමින් රණවිරු අධිකාරිය වෙත පරිත්‍යාග මත ලැබුණු පෞද්ගලික ඉඩමක ඇති ගොඩනැඟිල්ල මේ වන විට සංවර්ධනය කරමින් පවතින අතර මෙම ගොඩනැඟිල්ල අළුත්වැඩියා කිරීම හා සංවර්ධන ශාලා ඉදිකිරීම මේ වන විට සිදුවෙමින් පවති. මෙම වැඩිහිටි නිවාසය ඉදිකිරීමේ කටයුතු ශ්‍රී ලංකා යුධ හමුදාවේ ඉංජිනේරු බලකාය මගින් සිදු කරනු ලැබේ.

6.3. “ විරුසර ” වරප්‍රසාද කාඩ්පත



“ විරුසර ” වරප්‍රසාද කාඩ්පත ත්‍රිවිධ හමුදාවේ, පොලිස් හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවයේ සිටිය දී මිය ගිය, අතුරුදහන් හා යුද්ධයෙන් තුවාල ලබා වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ලබා සිටින රණවිරුවන්ට සහ ඔවුන්ගේ ලහම ඥාතීන් වෙත හදුන්වා දී ඇත.

මේ තුලින් ආබාධිතව විශ්‍රාම ලබා ඇති රණවිරුවන්ට සහ මියගිය සහ අතුරුදහන් රණවිරුවන්ගේ ලහම ඥාතීන් වෙත ඔවුන්ගේ එදිනෙදා සිදු කර ගැනීමට නියමිත බැංකු කටයුතු, රෝගාබාධයන්ට ප්‍රතිකාර ලබා ගැනීම්, රණවිරු දරුවන්ගේ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අවශ්‍යතා සහ නිවසට අවශ්‍ය භාණ්ඩ විදුලි උපකරණ ඇතුළු අනෙකුත් අවශ්‍යතා මෙන්ම දුම්රිය ගමන් සහන වැනි විශාල සහන ප්‍රමාණයක් ලබා ගැනීමට රජයේ සහ පෞද්ගලික ආයතන 58 ක් මඟින් මෙම කාඩ්පත් ලාභීන් වෙත සහන ලබා දීමට බැඳී සිටී. මෙම කාඩ්පත මඟින් රණවිරුවන්ගේ සහ රණවිරු ඥාතීන්ගේ රණවිරුවන් කෙරෙහි සමාජයෙන් ඇති වන අභිමානය ඔප්නැංවීම සහ ඔවුන්ගේ මානසික

තත්ත්වය ඉතා උසස් මට්ටමකින් පවත්වා ගෙන යාමට සහ ආර්ථික තත්ත්වයන් සඳහා විශාල රුකුලක් ලබා දී ඇත.

ඒ අනුව 2016 වර්ෂයේ **" විරුසර " වරප්‍රසාද කාඩ්පත් ප්‍රධාන උත්සව පහත පරිදි පවත්වා ඇත.**

අනු අංකය	දිනය	ස්ථානය
01	2016.01.25	කොළඹ අරලියගහ මන්දිරයේ දී
02	2016.02.27	අනුරාධපුර ගජබා රෙජිමේන්තුවේ දී
03	2016.03.01	කුරුණෑගල විජයබා රෙජිමේන්තුවේ දී
04	2016.03.11	රත්නපුර ගැමුණු රෙජිමේන්තුවේ දී
05	2016.03.23	කෑගල්ල සිංහ රෙජිමේන්තුවේ දී
06	2016.04.08	හෝමාගම පාබල හමුදා රෙජිමේන්තුවේ දී
07	2016.04.30	හම්බන්තොට මාගම්පුර සම්මන්ත්‍රණ ශාලාවේදී
08	2016.06.27	නිගුරක්ගොඩ ගුවන් හමුදා කඳවුරේ දී
09	2016.12.09	ගනේමුල්ල කමාන්ඩෝ රෙජිමේන්තුවේ දී

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)

6.4. රණවිරු සුවඳ සාහිත්‍ය උත්සවය



කලාව භාවිතයෙන් උසස් චින්තනමය විප්ලවයක් ඇති කිරීම සහ මානසික ආතතිය අවම කිරීම, ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කිරීම, "සංහිදියාව" ජාතික ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙල සඳහා යුද වෘත්තිය අත්දැකීම් තුළින් කලාව භාවිතයෙන් පුළුල් කථිකාවතක් ගොඩනැඟීම, රණවිරුවා සම්බන්ධයෙන් එල්බ සිටින මතවාදයේ වෙනසක් ඇති කිරීම හා ඉහළ රසඥතාවයක් සහිත සහ සංවේදී ප්‍රජාවක් ලෙස රණවිරුවන් ජනගත කිරීම මෙමඟින් අපේක්ෂිතය.

රණවිරු සාහිත්‍යක් ගොඩනැංවීමට අවශ්‍ය වන පරිදි ජාතික, පළාත් හා ප්‍රාදේශීය මට්ටමින් රණවිරු සාහිත්‍ය නිර්මාණ කෙරෙහි උද්යෝගය වර්ධනය කිරීම උදෙසා, තරගාවලියක් වාර්ෂිකව පැවැත්වීම මඟින් රණවිරු පවුල්වල සාමාජිකයන්ගේ සහ රණවිරුවන්ගේ කලා දක්ෂතාවයන් හා කුසලතාවයන් ඔප්නැංවීම සහ ඇගයීමක් ලබා දීම මෙමඟින් අපේක්ෂිතය. මෙහි ඉලක්ක කණ්ඩායම සේවයේ යෙදී සිටින සහ දිවිපිදූ/ අතුරුදන්/ ආබාධිත රණවිරුවන්/ ඔවුන්ගේ දූ දරුවන්/ දෙමාපියන්/ බිරින්දෑවරුන් වේ. ඒ අනුව ඔවුන් සඳහා වන තරග අංශ පහත පරිදි වේ.

රණවිරු තරග අංශය	: නර්තන/ බෙර වාදන/ ගායන/ වාදන/ පද්‍ය රචනා/ ගීත රචනා/ කෙටි කතා/ චිත්‍ර
රණවිරු දෙමාපිය/ බිරින්දෑවරුන්	: අත්කම්/ පද්‍ය රචනා/ ගීත රචනා/ කෙටිකතා / ගීත ගායනා
රණවිරු දූ දරු	: නර්තන/ බෙර වාදනය/ ගායනා/ වාදන/ නිවේදන/ ගද්‍ය රචනා/ පද්‍ය රචනා/ කථික / චිත්‍ර
විවෘත	: ගද්‍ය රචනා/ පද්‍යා රචනා/ කෙටි කතා

ඒ අනුව 2016 වර්ෂයේ රණවිරු සුවඳ සාහිත්‍ය උත්සවය අප්‍රේල් මස 26 වන දින බිෂොප් විද්‍යාලයීය ශ්‍රවණාගාරයේ දී ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය රුවන් විජයවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි. මෙම උළෙලේ දී සම්මාන හා සහතික සහ මුදල් ප්‍රදානය කරන අතර රන් 80, රිදී 67 ක් හා ලෝකඩ 56 වශයෙන් සම්මාන 203 ක් හා විශිෂ්ඨ කුසලතා දැක්වූවන් 224 ක් වේ

6.5. රණවිරු කාන්තා හා ළමා සංවර්ධන ඒකකය



තිස් වසරකට ආසන්න කාලයක් පැවති යුද්ධය හේතු කොට ගෙන ව්‍යසනයට පත් රණවිරු කාන්තාවන් හා දරුවන් ඉලක්ක කොට ක්‍රියාත්මක කරනු ලබන බහුවිධ සංවර්ධන ප්‍රවේශයකින් යුත් මැදි හා දිගුකාලීන පුනරුත්ථාපන වැඩසටහනක් ලෙස කාන්තා හා ළමා සංවර්ධන වැඩසටහන හැඳින්විය හැකිය. මෙහි ඉලක්ක ගත කණ්ඩායම ලෙස රණවිරු මව්වරුන්, බිරින්දෑවරුන්, ආබාධිත විශ්‍රාමික රණවිරුවාගේ බිරින්දෑවරුන් හා රණවිරු දියණියන් ගනු ලබන අතර ව්‍යාපෘතියේ අරමුණු පහත පරිදි වේ.

* රණවිරු කාන්තා පවුර, සංවිධාන ගොඩනැඟීම
* රණවිරු කාන්තාව හා දරුවන් මනෝ සමාජීය හා සෞඛ්‍යමය ලෙස සවිබල ගැන්වීම
* රණවිරු කාන්තාව ආර්ථික ලෙස සවිබල ගැන්වීම
* රණවිරු කාන්තාව හා දරුවන් සංස්කෘතික හා අධ්‍යාත්මික ලෙස සවිබල ගැන්වීම
* පුද්ගල හා සාමාජ ජීවිතයේ දී ඇතිවන ගැටළු සහගත අවස්ථාවන් සඳහා මුහුණ දීමට අවශ්‍ය නීති උපදෙස් ලබා දීම, මහපෙන්වීම හා සහයෝගය ලබා දීම.

ඒ අනුව 2016 වර්ෂයේ වැඩසටහන් පැවැත්වීම පහත පරිදි සිදු කර ඇත.

අනු අංකය	වැඩසටහන	දිනය/ දිනයන්
01	රණවිරු කාන්තා බැහැරගත පුහුණු වැඩමුළුව	2016.09.13, 14, 15
02	කාන්තා ආර්ථික සකසුරුවම් හා කළමනාකරණය	2016.10.27
03	කාන්තා ආර්ථික සකසුරුවම් හා කළමනාකරණය	2016.11.17
04	කාන්තා ආර්ථික සකසුරුවම් හා කළමනාකරණය	2016.11.18

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)

6.6. ක්‍රීඩා අංශය



රණවිරු සංසද සාමාජිකයන් ලෙස කටයුතු කරන රට ජාතිය වෙනුවෙන් ශරීර අංග කැප කළ ආබාධිත වූ රණවිරුවන්ගේ දක්ෂතාවයන් සොයා බලා ජාතික ක්‍රීඩාව වන වොලිබෝල් ක්‍රීඩාව පිළිබඳ දක්ෂතාවය සහ කැමැත්ත ඇති දිවයින පුරා විසිරි ඇති රණවිරු සංසදයන්හි ආබාධිත රණවිරුවන්ගෙන් 150 පිරිසකගේ සහභාගිත්වයෙන් පළාත් මට්ටමින් තරගාවලියක් පවත්වා ඉන් තෝරා ගනු ලැබූ රණවිරු ක්‍රීඩකයන්, 24 දෙනෙකුගෙන් යුතු සංචිතයක් ගොඩනඟනු ලැබිය. තේරීම් කමිටුවක් මඟින් නැවත ක්‍රීඩකයන් 12 දෙනෙකු තෝරා ගන්නා ලදී.එම සංචිතයේ ක්‍රීඩකයන් හෙයියන්තුඩුව තරුණ සේවා පුහුණු මධ්‍යස්ථානයේදී දින 05ක පුහුණුවක් ලබා දී

ජාතික මට්ටමෙන් යුතු කණ්ඩායමක් ගොඩනඟන ලදී. ඒ අනුව රණවිරු සේවා අධිකාරිය විසින් පැවැත්වූ වොලිබෝල් තරගාවලියේ විස්තර පහත පරිදි වේ.

* 2016.අගෝස්තු මස 10 සහ 11 යන දින වලදී ආබාධිත වොලිබෝල් කණ්ඩායමේ තේරීම් තරගාවලිය පවත්වන ලදී.

* 2016.08.10,11 සහ 2016.08.30,31 සහ 2016.09.01,02 රණවිරු වොලිබෝල් පුහුණු නේවාසික කඳවුර හෙයියන්තුඩුව තරුණ සේවා සභා පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වීම.

* 2016.09.18 දින අවිස්සාවේල අනෝමා ක්‍රීඩාංගනයේ වොලිබෝල් තරගාවලියක් පැවැත්වීම.

* 2016.09.29 දින ගාල්ල සැම්සන් ඉන්ට්‍රර්නැෂනල් පුද්ගලික ආයතනය මගින් එම ආයතනයේ වොලිබෝල් කණ්ඩායම සහ රණවිරු සේවා අධිකාරියේ වොලිබෝල් කණ්ඩායම අතර තරගයක් එම පරිශ්‍රයේදී පැවැත්විණි.එම තරගයේ ජයග්‍රහණය රණවිරු සේවා අධිකාරියේ වොලිබෝල් කණ්ඩායමට ලැබුණි.

* ඉන්දියාවේ මයිසුර් ප්‍රාන්තයේදී පැවැත්වෙන සාම කුසලාන පැරා වොලිබෝල් තරඟයට අප අධිකාරියේ වොලිබෝල් කණ්ඩායම ඇරයුම් ලබා තිබීම නිසා එයට සහභාගී වීමට පෙර වොලිබෝල් පුහුණු කඳවුරක් 2016.11.03 දින සිට 2016.11.07 දින දක්වා පැවැත්විය.


* 2016.10.05 දින සිට 10 දින දක්වා ඉන්දියාවේ මයිසුර් ප්‍රාන්තයේදී පැවැත්වූ සාම කුසලාන පැරා වොලිබෝල් තරගවලිය සඳහා ඇරයුම් ලබා එයට සහභාගී වී දක්ෂ ලෙස ක්‍රීඩා කරන ලදී. ආබාධිත රණවිරු ක්‍රීඩකයන් 12 දෙනකු, අධිකාරියේ ක්‍රීඩා භාර නිළධාරි, මධ්‍යම පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ පුහුණුකරුවන් දෙදෙනෙකු මේ සඳහා සහභාගී විය.ඒ සඳහා අප අධිකාරිය විසින් ඔවුන්ට ගුවන් ටිකට් පත් සහ ක්‍රීඩා කණ්ඩායමට අවශ්‍ය අනෙකුත් ප්‍රතිපාදන ලබා දෙන ලදී.

රණවිරු සේවා කාර්යයන් සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය හෝ සියළු ක්‍රියා කටයුතු කිරීම වෙනුවෙන් 2016 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය පහත පරිදි වේ.

අධිකාරියේ කාර්යයන් සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය හෝ සියළු ක්‍රියා හා කටයුතු කිරීම	2016 භෞතික		2016 මූල්‍ය (රු. මී)	
	ඉලක්කය	ප්‍රගතිය	වෙන්කිරීම	ප්‍රගතිය
දිස්ත්‍රික්ක දැනුවත් කිරීම	19	19	2.40	2.39
සංසද පොකුරු වැඩසටහන්	30	33	1.00	0.96
ජාතික රණවිරු දිනය හා පළාත් සැමරුම්	09	09	7.28	7.24
රණවිරු සැමරුම් උද්‍යාන නඩත්තුව හා සංවර්ධනය	1	වර්ෂය පුරා නඩත්තු වියදම් දැරීම	0.57	0.55
යාකබැද්ද වැඩිහිටි නිවාසයක් ලෙස සංවර්ධනය කිරීම	01	85%	3.74	3.57
ක්‍රීඩා කඳවුරු හා ක්‍රීඩා සමාජ ගොඩනැංවීම	20	10	1.44	1.44
රණවිරු සුවඳ කළා මංගල්‍යය	01	01	1.16	1.06
රණවිරු කාන්තා සංවිධාන ගොඩනැඟීම	275	275	-	-

කාන්තාවන් ආර්ථික හා සංස්කෘතික ලෙස බලගැන්වීම	06	03	2.84	0.50
බැහැරගත පුහුණු වැඩමුළු	01	01	0.40	0.28
විරුසර වරප්‍රසාද කාඩ්පත් ලබා දීම		25267	1.00	0.25

(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)



(මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය)

විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඒ.ජී.එම්/ඩී/ආර්එස්ඒ/01/16/11 මබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017 අගෝස්තු 08 දින

සභාපතිනිය,

රණවිරු සේවා අධිකාරිය

රණවිරු සේවා අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

රණවිරු සේවා අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, නිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරී පනතේ 9(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපතිනිය වෙත 2017 අප්‍රේල් 20 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම සඳහා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට රණවිරු සේවා අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය වෙත වර්ෂ 05 කට පමණ පෙර පරිත්‍යාග වශයෙන් ලැබී සමාලෝචිත වර්ෂය වන විට හිමිකම පවරා තිබුණු පර්චස් 659.9 ක් වන ඉඩම් කොටස් 7ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අධිකාරියේ විදුලි සෝපානය සවි කිරීම, පරිගණක ජාලගත කිරීම හා කාර්යාල උපකරණ මිලදී ගැනීම යනාදී කාර්යයන් සමාලෝචිත වර්ෂය තුළදී නිමකර තිබුණු නමුත් ඒ සඳහා වැය කර තිබූ රු. 12,615,747 ක් දේපළ පිරියත උපකරණ යටතේ ගිණුමගත කිරීම වෙනුවට නොනිමි වැඩ යටතේ දක්වා තිබුණි. එම නිසා එම වත්කම් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයට අදාළ රු.274,907 ක් වූ ක්ෂය ගිණුම් වලින් අත්හැරී තිබුණි.

(ඇ) ගොඩනැගිලි අළුත්වැඩියාවන් සඳහා සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබූ රු.103,246 ක පුනරාවර්තන වියදම්, නොනිමි වැඩ යටතේ ප්‍රාග්ධන වියදමක් වශයෙන් දක්වා තිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව පැවති රු.110,633 ක මෝටර් වාහන අළුත් වැඩියා වියදම් සහ ඒ සඳහා ලැබිය යුතු රක්ෂණ වන්දි රු.110,633 ක් ගිණුම්ගත කර නොතිබුණි.

2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

2009 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින තෙක් බාහිර පාර්ශවයන්ගෙන් අධිකාරිය වෙත පරිත්‍යාග ලෙස ලැබී තිබුණු වත්කම් පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉල්ලා තිබුණ නමුත් 2017 මාර්තු 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති, රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම්
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 110	අධිකාරිය විසින් හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 770 හා 771	පාවිච්චි කල නොහැකි ඉන්වෙන්ට්‍රි භාණ්ඩ 198 ක් අපහරණය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය මගින් ලබා දෙනු ලැබූ නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණි.
(iii) මුදල් රෙගුලාසි 371	2014 වර්ෂය තුළදී අධිකාරියේ නිලධාරීන් දෙදෙනකුට අවස්ථා 5 කදි ලබා දී තිබුණු එකතුව රු.1,830,450 ක අත්තිකාරම් මුදල 2017 ජනවාරි 26 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

3 මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රණවිරු සේවා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.32,013,286 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.44,621,195 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයෙහි මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,607,909 ක වර්ධනයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව අධිකාරියේ මුළු වියදම රු.45,151,077 කින් වැඩිවී තිබුණද රජයේ දායකත්වය හා වෙනත් ආදායම් ලැබීම් රු.57,758,986 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

රජයේ දායකත්වය හා වෙනත් ආදායම් ලැබීම් රු.57,758,986 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ රු.2,294,685 ක්ව පැවති අධිකාරියේ අතිරික්තය 2015 වර්ෂය වන විට රු.44,621,195 ක ඌනතාවයක් වී තිබුණද සමාලෝචිත වර්ෂයේදී එම ඌනතාවය රු.32,013,286 ක් දක්වා අඩුවී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.27,735,919 ක්ව පැවති අධිකාරියේ දායකත්වය 2015 වර්ෂයේදී රු.1,751,545 ක ඍණ අගයක් ගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේදී රු.23,513,293 ක් දක්වා නැවත වර්ධනය වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

ක්‍රියාන්විතයේදී මියගිය හා ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සමාජිකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සුභසාධනය ඉහළ නැංවීමත්, ආත්ම විශ්වාසයෙන් යුතු තෘප්තිමත් රණවිරු පවුල් සාමාජිකයන් පිරිසක් බිහිකිරීමත් අධිකාරියේ ප්‍රධාන අරමුණු වී තිබුණි. රණවිරු සුභසාධනය සැලසීම සඳහා අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබුණු විවිධ ව්‍යාපෘතිවල කාර්යසාධනය සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අඩු ආදායම්ලාභී රණවිරුවන් හා යැපෙන්නන් වෙනුවෙන් උපැස් යුගල බැගින් ලබා දීමේ වැඩසටහන 2011 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු අතර එය තවදුරටත් යාවත්කාලීන කිරීම සුදුසු බව රණවිරු සුභසාධනය සඳහා වූ මනෝසමාජීය ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද 2015 පෙබරවාරි 24 දිනැති ලිපිය මගින් නිර්දේශ කර තිබුණි. කෙසේ වෙතත්, මෙම වැඩසටහන යටතේ වූ කාර්යයන් 2016 වර්ෂයේදී නවතා දමා තිබුණි.

(ආ) රණවිරු සුභසාධනය උදෙසා ණය ලබාදීම වෙනුවෙන් ණය යෝජනා ක්‍රම 3 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 75.47 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. එහෙත් වෙන්කර තිබූ ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රණවිරුවන් වෙත ලබා දී තිබුණේ රු.මිලියන 54.86 ක් පමණක් වූ අතර, 2015 වර්ෂයේදී ක්‍රියාත්මක වූ ත්‍රීවිල් ණය යෝජනා ක්‍රමය 2016 වර්ෂයේදී නවතා දැමීම සහ වෛද්‍ය ණය සඳහා ලබාදී තිබූ මුදලින් සියයට 50 ක් පමණක් උපයෝජනය කර තිබීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රණවිරුවන්ගේ සුභසාධන කටයුතු සඳහා අධිකාරිය වෙත 2009 වර්ෂයේදී පරිත්‍යාග කර තිබුණු අකුරැස්ස යාකබැද්ද ප්‍රදේශයේ පිහිටි පර්චස් 302 ක නිවාසයක් සහිත ඉඩම ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් රු. 3,695,012 ක වියදමක් දරා තිබුණද 2016 දෙසැම්බර් 31 දින වන විටත් සුභසාධන කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.

(ආ) විදුලි සෝපානයක් මිලදී ගැනීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත 2015 ජූලි 21 දින රු.5,004,324 ක කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කිරීමට ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කර තිබූ නමුත් ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීමට අධිකාරිය විසින් 2015 දෙසැම්බර් 01 වන දින දක්වා මාස 05 කින් ප්‍රමාද කිරීම හේතුවෙන් රු.457,231 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

4.3 අරමුදල් ඌන උපයෝජනය

අධිකාරියේ අරමුණු සඳහා යොදාගත යුතු අරමුදල් වලින් රු.41,927,306 ක් අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදා නොගෙන සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ බැංකු ජංගම ගිණුමක මාස 05 ක කාලයක සිට ඌන උපයෝජිතව තිබුණි.

4.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වසර 3 කට අධික කාලයක් තිස්සේ ධාවනයෙන් ඉවත් කර තිබූ වෑන් රථයක්, යතුරු පැදියක් සහ වෙන්දේසියේ විකිණීමට අනුමැතිය ලබා දී තිබූ වෑන්රථ දෙකක් හා කැබ් රථ දෙකක් 2013 ජුනි 05 දිනැති ජනාධිපති ලේකම්වරයාගේ අංක පීසීඑම්ඩී/පිඅාර්/2013 දරන ලිපිය ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රණවිරුවන් හා ඔවුන්ගේ යැපෙන්නන් වෙත රණවිරු ප්‍රමුඛතා හැඳුනුම්පත් මුද්‍රණය කිරීම වෙනුවෙන් 2014 අගෝස්තු 25 දින රු.651,739 කට මිලදී ගෙන තිබූ මුද්‍රණ යන්ත්‍රයක් ඌන උපයෝජිතව සහ 2015 සැප්තැම්බර් 30 වන දින අධිකාරිය වෙත පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 05 ක් නිශ්ක්‍රීයව පැවතුණි.

(ඇ) රණවිරුවන්ගේ අවශ්‍යතා හඳුනාගෙන බෙදාහැරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමකින් තොරව විවිධ පරිත්‍යාගශීලීන්ගෙන් අධිකාරිය වෙත ලැබී තිබුණු රු.401,064 ක් වටිනා භාණ්ඩ 2017 මාර්තු 31 දින වන විටත් ගබඩාව තුළ රඳවා තිබුණි. මෙම භාණ්ඩ අතුරින් රු.8,064 ක් වටිනා භාණ්ඩ අධිකාරිය වෙත ලැබී තිබුණේ 2012 වර්ෂයේදීය.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරී පනතේ 5 (ඈ) වගන්තිය අනුව නිලධාරීන් සේවයේ නියුක්ත කිරීමේ බලතල කළමණාකරණ මණ්ඩලය වෙත පවරා තිබුණු අතර සභාපතිනිය විසින් සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් 11 දෙනෙකු තනතුරුවලට පත්කර 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමණාකරන චක්‍රලේඛයේ ඇතුළත් එම්.එම්-1-1-2006 වැටුප් ක්‍රමයේ පියවර 06 ක් ඉදිරියෙන් පිහිටුවා තිබුණු බව නිරීක්ෂණය විය. අධිකාරියේ සභාපතිතුමියගේ පැහැදිළි කිරීම අනුව, මෙම පත් කිරීම් සම්බන්ධයෙන් අනුමැතිය ලබාගැනීම සඳහා 2015 අගෝස්තු 31 දින අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය වෙත තොරතුරු ඉදිරිපත් කර තිබුණු නමුත් කළමනාකරණ මණ්ඩලය විසින් වැඩිදුර විමර්ශනය සඳහා කමිටුවක් පත් කර තිබුණි. කෙසේ වෙතත් අදාල කමිටු වාර්තාව 2017 ජුනි 30 දින වන විටත් ලැබී නොතිබුණි.

(ආ) 2007 අගොස්තු 24 දිනැති අංක 09/2007 (1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව විශ්‍රාමික පුද්ගලයකු අධිකාරියේ පරිපාලන නිලධාරී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන 2016 වර්ෂයේදී දීමනා ලෙස රු.306,253 ක් ගෙවා තිබුණි.

5. ගිණුම් කටයුතු හා යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

රණවිරු සේවා අධිකාරියේ අභ්‍යන්තර විගණක තනතුර 2013 ජූලි 05 අනුමත කර තිබුණු නමුත්, මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව 2017 මාර්තු 31 දින වනවිටත් එම තනතුර සඳහා ස්ථිර අභ්‍යන්තර විගණකවරයෙකු බඳවාගැනීමට කටයුතු කර නොතිබුණි. අධිකාරියේ අභ්‍යන්තර විගණන කටයුතු ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අභ්‍යන්තර විගණන අංශය මගින් සිදුකර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී නිකුත් කරන ලද විගණන විමසුම් 03 ක් සඳහා පිළිතුරු සපයා නොතිබුණි.

5.2 ප්‍රසම්පාදන සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ අනුමත ප්‍රසම්පාදන සැලැස්ම අනුව රු.මිලියන 48.23 ක භාණ්ඩ මිලදී ගැනීමට සැලසුම් කර තිබුණි. එහෙත් අධිකාරියේ ප්‍රධාන අරමුණක් වන ආබාධිත රණවිරුවන්ගේ සුභසාධනය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබූ, රෝද පුටු, අත්වාරු, කිහිලිකරු යනාදිය මිලදී ගැනීම සඳහා කිසිදු ඇස්තමේන්තුවක් ප්‍රසම්පාදන සැලැස්ම තුළ ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂය සඳහා අධිකාරිය විසින් සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්මට අනුව ඉටුකරගත යුතුව තිබූ ප්‍රසම්පාදන කටයුතු වලින් රු. මිලියන 4.53 ක්වූ ප්‍රසම්පාදන කටයුතු 2016 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. එම ප්‍රසම්පාදන කටයුතු සියල්ලක්ම ඉකුත් වර්ෂ තුනක ප්‍රසම්පාදන සැලසුම්වල ඇතුළත් කර තිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර රණවිරු සේවා අධිකාරියේ සභාපතිනියගේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතුය.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) ප්‍රසම්පාදනය	කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු නොකිරීම.
(ආ) අත්තිකාරම් පාලනය	අත්තිකාරම් නිකුත් කිරීම, පියවීම හා ඒවා උපයෝජනය කිරීම සම්බන්ධව නිසි අධීක්ෂණයක් සිදු නොවීම.
(ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය	පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම හා ප්‍රගති සමාලෝචනය නොකිරීම.
(ඈ) ගිණුම්කරණය	වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

අවසාන ගිණුම් ප්‍රකාශනය

..... මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය
..... මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය
..... මුදල් ප්‍රවාහ ප්‍රකාශය
..... මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය
..... මූල්‍ය ප්‍රකාශන හා ගිණුම් ප්‍රතිපත්ති



රණවිරු සේවා අධිකාරිය
2016-12-31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය

	සටහන්	2016		2015	
		රු.ශත	රු.ශත	රු.ශත	රු.ශත
වත්කම්					
ජංගම වත්කම්					
මුදල් සහ මුදල් සමාන දෑ	1		128,640,679.95		97,697,787.94
තැන්පතු	2		245,641.38		230,141.38
කලින් ගෙවීම්	3		203,702.10		208,177.44
ලැබිය යුතු ණය හා පොළි	4	217,565,340.95		286,922,824.98	
අඩුකලා					
අඩමාණ ණය වෙන් කිරීම්		1,863,296.98		2,388,564.49	
			215,702,043.97		284,534,260.49
ලිපිදව්‍ය තොග	5		487,258.45		370,994.74
එකතුව	01		345,279,325.85		383,041,361.99
ජංගම නොවන වත්කම්					
ස්ථාවර තැන්පතු	6		28,000,000.00		28,000,000.00
නොනිමි වැඩ	7		12,305,946.51		7,004,308.68
යටිතල.පිරියත හා උපකරණ	8		18,046,261.48		22,688,591.46
ඉඩම් හා ගොඩනැගිලි	9		206,610,697.56		210,171,211.44
එකතුව	02		264,962,905.55		267,864,111.58
මුළු වත්කම්	**(03=01+02)**		**610,242,231.40**		**650,905,473.57**
බැරකම්					
ජංගම බැරකම්	**10**		14,158,114.66		25,812,499.37
එකතුව	04		14,158,114.66		25,812,499.37
ජංගම නොවන බැරකම්	**11**		16,035,081.70		12,398,865.51
එකතුව	05		16,035,081.70		12,398,865.51
මුළු බැරකම්	**(06=04+05)**		30,193,196.36		38,211,364.88
ශුද්ධ වත්කම්	**(03-06)**		**580,049,035.04**		**612,694,108.69**
ශුද්ධ වත්කම්/ස්කන්ධය					
රණවිරු දුදරු සුවසෙත අරමුදල			105,710.00		70,210.00
සේවක ණය චක්‍රිය අරමුදල			9,719,567.67		9,502,889.50
ප්‍රත්‍යාගණන සංචිතය			81,835,290.21		81,835,290.21
සමුච්චිත					
අතිරික්තය/(ඌණතාවය)			488,388,467.16		521,285,718.98
මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය					
(01+02-06)			**580,049,035.04**		**612,694,108.69**

ඉහත මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය අංක 02 සිට 28 දක්වා පිටුවල සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්වල ගැලපීම් සමග කියවිය යුතුය.

කළමනාකරණ මණ්ඩලයේ උපදෙස් පරිදි පිළියෙල කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශණය ඉදිරිපත් කිරීමේ වගකීම කළමනාකරණ මණ්ඩලය විසින් භාරගන්නා ලදි. කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශණ අත්සන් කිරීමේ හා නිකුත් කිරීමේ අධිකාරී බලය සභාපතිතුමිය හා සහකාර අධ්‍යක්ෂ මූල්‍ය වෙත 2017-02-28 දින ලබාදෙන ලදි.

ටී.වී.සෙම්බුකුට්ටිආරච්චි
සහකාර අධ්‍යක්ෂ මූල්‍ය
රණවිරු සේවා අධිකාරිය

අනෝමා ගොන්සේකා
සභාපතිනි
රණවිරු සේවා අධිකාරිය

රණවිරු සේවා අධිකාරිය
2016-12-31 දිනෙන් අවසන් වසර සඳහා මුල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

	සටහන්	2016	2015
		රු.ශත	රු.ශත
ආදායම්			
රජයේ දායකය (පුනරාවර්ථන)	12	324,095,216.56	262,355,327.56
සුපිර වාසනා සම්පත ලොතරැයි ආදායම		93,469,320.00	97,788,660.00
පොළි ආදායම	13	4,578,964.08	3,808,386.54
සේවක ණය පොළි ආදායම		216,678.17	210,488.53
සේවා ගාස්තු	14	14,048,846.73	13,160,524.84
රණවිරු කොඩි අලෙවි ආදායම	15	4,576,517.00	5,854,429.27
පරිත්‍යාග	16	2,310,336.00	3,021,648.34
වෙසක් පත් අලෙවි ආදායම	17	-	70,210.00
සැපයුම්කැවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු		25,900.00	15,600.00
අඩමාණ ණය අධි වෙන්කිරීම්		525,267.51	
වෙනත් ලැබීම්	18	477,906.56	280,691.10
මුළු ආදායම් (01)		444,324,952.61	386,565,966.18
වියදම්			
පුද්ගල පඩිනඩි	19	45,422,388.46	33,172,764.33
ගමන් වියදම්	20	879,316.78	461,655.00
සැපයීම්	21	4,135,175.68	2,926,076.97
නඩත්තු වියදම්	22	2,781,686.56	4,657,457.75
ගිවිසුම්ගත සේවා	23	12,296,926.87	6,450,223.47
වෙනත් පුනරාවර්ථන වියදම්	24	2,004,949.60	2,394,247.91
ව්‍යාපෘති මෙහෙයුම් වියදම්	25	398,402,154.37	370,877,055.97
ක්ෂය කිරීම		10,104,189.97	9,696,886.14
මුල්‍ය වියදම්	26	311,449.95	261,403.39
භාණ්ඩ පරිත්‍යාග කිරීම්	27	-	289,390.28
මුළු වියදම (02)		476,338,238.24	431,187,161.21
කාලපරිච්ඡේදයේ මුළු අතිරික්තය/ (ඌනතාවය) (01-02)		(32,013,285.63)	(44,621,195.03)

රණවිරු සේවා අධිකාරිය

2016-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන්	2016	2015
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		රු.ශත	රු.ශත
අතිරික්තය/ (ඌනතාවය)		(32,013,285.63)	(44,621,195.03)
ගැලපීම්			
ක්ෂය කිරීම		**10,104,189.97**	9,696,886.14
පාරිතෝෂික දිමනා සඳහා වෙන්කිරීම		2,055,286.00	1,554,599.50
භාණ්ඩ පරිත්‍යාග කිරීම්		-	289,390.28
පොළී ආදායම		(4,578,964.08)	(3,808,386.54)
ප්‍රත්‍යාගණන අලාභය (ලාභය)			
අතිවිශේෂ අයිතම		(324,600.06)	(6,384.61)
කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීමට පෙර මෙහෙයුම් අතිරික්තය/ (ඌනතාවය)		**(24,757,373.80)**	**(36,895,090.26)**
ලිපිදත්ත තොග (වැඩිවීම)/අඩුවීම		**(116,263.71)**	(155,777.58)
තැන්පතු (වැඩිවීම)/අඩුවීම		**(15,500.00)**	(140,141.38)
කලින් ගෙවීම් (වැඩිවීම)/අඩුවීම		**4,475.34**	(208,177.44)
ගෙවිය යුතු මුදල් වැඩිවීම/ (අඩුවීම)		**(11,654,384.71)**	11,323,139.42
ලැබිය යුතු මුදල් (වැඩිවීම)/අඩුවීම		**68,832,216.52**	10,744,422.26
පාරිතෝෂික දිමනා ගෙවීම			
මෙහෙයුම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය වැඩිවීම/ (අඩුවීම)		**32,293,169.64**	**(15,331,624.98)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**32,293,169.64**	**(15,331,624.98)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය			
ඉඩම් හා ගොඩනැගිලි විකුණුම්/ (ගැනුම්)		-	
යන්ත්‍ර උපකරණ විකුණුම්/ (ගැනුම්)		(246,590.00)	(4,134,530.00)
ගෘහභාණ්ඩ විකුණුම්/ (ගැනුම්)		(1,281,013.88)	(2,322,867.76)
නොනිමි වැඩ		(5,301,637.83)	(7,004,308.68)
පොළී ආදායම		4,578,964.08	3,808,386.54
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**(2,250,277.63)**	**(9,653,319.90)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය			
රජයේ ප්‍රධාන ලැබීම්		900,000.00	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**900,000.00**	**-**
මුදල් හා මුදල්වලට ආසන්න දැ වල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		**30,942,892.01**	**(24,984,944.88)**
කාලපරිච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල්වලට ආසන්න අයිතමයන්		**97,697,787.94**	122,682,732.82
කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල්වලට ආසන්න අයිතමයන්	**01**	**128,640,679.95**	**97,697,787.94**

රණවිරු සේවා අධිකාරිය
2016-12-31 දිනෙන් අවසන් වසර සඳහා මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

විස්තරය	සටහන්	රණවිරු දුදරු සුවසෙත අරමුදල	සේවක ණය චක්‍රිය අරමුදල	ප්‍රත්‍යාගණන සංචිතය	සමුච්චිත අතිරික්තය/ (ඌනතාවය)	මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය
			රු.ශත	රු.ශත		රු.ශත
2015-01-01 දිනට ශේෂය **(01)**		-	9,292,400.97	81,835,290.21	565,959,084.25	657,086,775.43
ගැලපීම් (02)	**28**	-			575,557.42	575,557.42
						-
භාණ්ඩ පරිත්‍යාග (03)	**29**				190,000.00	190,000.00
						-
රණවිරු දුදරු සුවසෙත අරමුදල (4)		**70,210.00**			(70,210.00)	-
						-
